# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 11 ශ්‍රේණිය

(2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව.
www.nie.lk
info@nie.lk

ක්‍රිස්තියානි ධර්මය

11 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2016
ජාතික අධ්‍යාපන ආයතනය
ISBN

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය.

**අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත් වන සහ එකොළොස් ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිතා කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළබඳව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂය මාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය**
: ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

: ගරු රෙක්ස් කොන්ස්ටන්ටයින් පියතුමා
ව්‍යාපෘති නායක
ආගම් දෙපාර්තමේන්තුව

**උපදේශක මණ්ඩලය:**

අතිගරු ඩිලෝරාජ් කනගසබේ රදගුරුතුමා
ලංකා සභාව, කොළඹ දියෝකීසිය.

අතිගරු ශාන්තා ෆ්‍රැන්සිස් රදගුරුතුමා.
ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය.

අතිගරු ආචාර්ය ඩැනියල් එස්. ත්‍යාගරාජා රදගුරුතුමා.
දකුණු ඉන්දියානු සභාව.

ගෞ. ආචාර්ය ඒ. ඩබ්. ජෙබනේසන් දේවගැතිතුමා.
මහනායකතුමා, ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාව.

ගෞ. ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා.
සංගමාධිපතිතුමා, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

ගෞ. චාර්ලි ජැන්ස් දේවගැතිතුමා.
සභාපතිතුමා, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව.

ගෞ. සමන් පෙරේරා දේවගැතිතුමා.
ප්‍රෙස්බිටීරියන් සභාව.

කොමිෂනර් මැල්කම් ඉඳුරුවගේ.
ප්‍රාදේශීය මූලිකතුමා, ගැළවීමේ හමුදාව.

ගෞ. ඩබ්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා.
මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.

ගෞ. හේෂාන් ද සිල්වා දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

එම්. සභාරංජන් මහත්මිය.
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය.

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.

ගෞ. විලියම් විජේකෝන් දේවගැතිතුමා.
ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය.

**ලේඛක මණ්ඩලය** : ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා සල්ගාදු දේවගැතිතුමිය.
විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.
දේවධර්මවේදී, දිව්‍ය ශාස්ත්‍රවේදී, ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය)

එල්. නිලන්ති දීපා ද සිල්වා මිය.
බප/පිලි/මෙතොදිස්ත උසස් විදුහල - මොරටුව.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය), පුහුණු ගුරු (ක්‍රිස්තියානි ධර්මය)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය.
ශා. තෝමස් විදුහල - ගල්කිස්ස.
ශාස්ත්‍රපති (ක්‍රිස්තියානි අධ්‍යයනය, ක්‍රිස්තු ධර්මය, සිංහල)
අධ්‍යාපනපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා.

අරුණි ඉන්දිකා පෙරේරා ජයතුංග මිය.
බිෂොප් විදුහල, කොළඹ - 3.
දේව ධර්මවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. රේණුකා දමයන්ති මිය.
කු/ මාවතගම මධ්‍ය මහ විද්‍යාලය - කුරුණෑගල.
ශාස්ත්‍රවේදී උපාධි, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

එම්. පී. සෙල්වනිදි පෙරේරා මිය.
වෙස්ලි විදුහල, කොළඹ - 8.
විශ්‍රාමික ගුරු උපදේශක (ක්‍රිස්තියානි ධර්මය), පුහුණු ගුරු (විද්‍යාව)

ඩී. ස්ටෙලා දර්ශනී මෙනවිය.
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය.
දේවධර්මවේදී.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

ක්‍රිස්තියානි ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවාගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබාගැනීම පමණක් නොසෑහේ. හිස පමණක් පෝෂණය කරන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකිය. අධ්‍යාපනය තුළින් හදවත හා අතද පෝෂණය කළ යුතුය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පෙළ පොතට හා විෂය නිර්දේශයට අනුරූපව ලියා ඇත. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු කර ගැනීමට වගබලා ගත යුතුය.

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් ඵල වලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකිය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතුය. ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රිස්තියානි ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහිද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතුය. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී එකවිට කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙන හෙයින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ කල්වේලා ඇතිව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිතය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරු භවතා පංති කවවලදී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතුය.

**ගරු කාල්ටන් ජෝශප් ද සිල්වා පියතුමා**
ව්‍යාපෘති නායක
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය

පටුන


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ පණිවුඩය | iv |
| විෂය මාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix - xix |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 53 |
| විවිධ සහය | 54 |

## විෂය හැඳින්වීම

යහ ගුණ පිරි සමාජයක් බිහි කිරීම යුගයේ අවශ්‍යතාව ය වේ. ඒ සඳහා ආගම මගින් සුවිසල් මෙහෙවරක් ඉටු කරයි. එවන් සමාජයක් කරා දරුවන් ප්‍රවිශ්ඨ කරවීම ආගමික විෂය මාලා ප්‍රතිසංස්කරණයේ අභිප්‍රායයි. පරිපූර්ණ දරුවකු තුළ දැනුම, ආකල්ප, කුසලතා පමණක් නොව අන්තර් පුද්ගල හැකියාවන් හා යහ ගුණ වර්ධනය කිරීම ද අපේක්ෂිත ය.

දරුවකුට දේව රාජ්‍යයේ ප්‍රතිපත්තීන්ට හා ගුණාංගවලට අනුකූල ව තම කිතුනු විශ්වාසය හා ඇදහිල්ල සවිමත් කර ගනිමින් ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය තුළ විදහා දැක්වීම සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සම්පාදනය කර ඇත.

ශුද්ධ බයිබලය තුළින් එළි දැක්වෙන දේව වචනය පදනම් කර ගනිමින් විශේෂිත වූ කිතුනු දැක්ම, පැවැත්ම හා සත්‍යතාවන් මත ප්‍රධාන නිපුණතා පහක් පාදක කර ගනිමින් 6-11 ශ්‍රේණි සඳහා ක්‍රිස්තියානි ධර්මය විෂය මාලාව සකසා තිබේ.

11 වන ශ්‍රේණිය අවසාන වන විට තමා දිවි ගෙවන සමාජය තුළ පැන නැගෙන අභියෝග හමුවේ නොසැලී ක්‍රියා කරන හා ක්‍රිස්තුස් වහන්සේ තුළ තම ජීවිතය ගත කරන, සමාජය ආලෝකවත් කිරීමට හැකි දේව විශ්වාසයෙන් පරිපූර්ණ, නව යොවුන් කිතුනුවකු ලොවට දායාද කිරීම මෙම විෂය මාලාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ශිෂ්‍ය කේන්ද්‍රිය සන්දර්භයක් හරහා ජීවිතාදර්ශයෙන් ක්‍රියා කරමින්, කිතුනු අනන්‍යතාවය දරන දේව රාජ්‍යයේ පුරවැසියන් පිරිසක් බිහි කිරීමට ඇප කැප වී ක්‍රියා කිරීම කිතුනු දහම් ගුරුවරයකුගේ මහඟු වගකීමයි. මේ සඳහා සිසුන් තුළ අදාළ නිපුණතා වර්ධනය කිරීමටත් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සංකල්ප හා ක්‍රියාකාරකම් සාර්ථක ලෙස යොදා ගැනීමටත් අපේක්ෂා කෙරේ.

කිතුනු සාක්ෂිය හා ස්ථිර සාර ඇදහිල්ල පෙරදැරි කරගත් ශ්‍රී ලාංකේය ජන ජීවිතය සවිමත් කරන හා ලොව නංවන විජයග්‍රාහී කිතුනුවන් රැසක් නිර්මාණය කිරීමට මෙම ක්‍රියාදාමය හරහා අවකාශ ලැබෙනු නො අනුමානය.

**ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු**

**ජාතික පොදු අරමුණු**

පුද්ගලයාට හා සමාජයට අදාල වන ප්‍රධාන ජාතික අරමුණු කරා ලඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම් වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ලඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහු විධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමයේ ප්‍රවර්ධනය කිරීම තුළ ජාතිය ගොඩ නැගීමේ සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාවය තහවුරු කිරීම.
2. වෙනස්වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන ජාතික උරුමයේ මා හැඟි දායාදයන් හඳුනා ගැනීම හා සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ්වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයනට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස්වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමිකර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප සහ කුසලතා පෝෂණය කිරීම.

**පොදු නිපුණතා**

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා** — සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** — සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** — පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන් චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** — ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** — සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** — අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම.

හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

සීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අරමුණු

1. දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද, නිර්මාතෘ ද බව විශ්වාස කරමින් උන්වහන්සේ අපට දුන් දේව දායාදයන් ප්‍රයෝජන ගැනීමටත්, සුරැකීමටත්, සංරක්ෂණය කිරීමටත් ක්‍රියා කරයි.

2. යාච්ඤාවෙන් සවිමත් වීම තුළ ක්‍රිස්තුස් වහන්සේගේ අසීමිත ප්‍රේමය අත්දකිමින් සමාජය ආලෝකවත් කිරීමට කටයුතු කරයි.

3. ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමෙන් තම දක්ෂතා, හැකියා යහපත් සමාජ මෙහෙවරකට හා ජාතික සංවර්ධනයට යොමු කිරීමට ක්‍රියා කරයි.

4. ජාතික හා අන්තර් ආගමික සුහදතාවය වර්ධනය කර ගනිමින් සාර ධර්මයෙන් හෙබි සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දේව රාජ්‍යයේ වටිනාකම් පිටිවහලක් කර ගනියි.

5. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීමට දේව වචනය අත්වැලක් කර ගනියි.

6. පරිණත කිතුනු ජීවිත ක්‍රියාකාරීත්වය තුළින් ක්‍රිස්තුස් වහන්සේ ලොවේ මාංශවත් කරයි.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 01.<br>දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි. | 11.1.1<br>**ජුදෙව් සමාජ දර්ශනය පිළිබඳ ගැඹුරින් හදාරයි.** | 11.1.1 **ජුදෙව් සමාජය**<br>(**උත්පත්ති** 12:2-3, 13:14-17, 18:1-15, 21:1-8,<br>**යෙසායා** 19:25, 45: 1-4<br>**නික්මයාම** 20, **ජෙරමියා** 29:5-7, **ද්විතිය කථාව** 7:6-8 **ලෙවී** 25) | • ජුදෙව් සමාජ දර්ශනය පිළිබඳ කරුණු ගොනු කරයි<br>• දේව කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>• යහපත් කිතුනු වටිනාකම් වර්ධනය කර ගනියි.<br>• දස පනත අනුව යහපත් සමාජයක් ගොඩ නැංවීමට ක්‍රියාකාරී වෙයි. | 2 |
| | 11.1.2<br>**මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක් ලබයි.** | 11.1.2 **මෙසියානු සංකල්පය**<br>(**යෙසායා** 9:1-7, 11:1-9) | • මෙසියානු සංකල්පය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• මෙසියස් තුමා සාමයේ කුමාරයාණෝ බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි.<br>• මෙසියස් වහන්සේ තුළින් ජීවිත ආලෝකය අත්දකියි.<br>• යුක්තිය හා ධර්මිෂ්ඨකම වෙනුවෙන් සාමූහික ව කැප වෙයි. | 2 |
| | 11.1.3<br>**යහපත් එඬේර ගුණාංග චරිතායනය කරයි.** | 11.1.3 **එඬේරත්වය**<br>(**එසකියෙල්** 34, **ගීතාවලිය** 23, **ශු. ජොහාන්** 10 : 7-19) | • යහපත් එඬේරාණන්ගේ ගුණාංග පිළිබඳ කරුණු ගොනු කරයි<br>• දෙවියන් වහන්සේ අපගේ එඬේරා බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ලිපියක් ඉදිරිපත් කරයි.<br>• යහපත් එඬේරාගේ ගුණාංග චරිතායනය කරයි<br>• සැම හා එක් ව එඬේරික සේවාවට සහයෝගය දක්වයි. | 2 |
| | 11.1.4<br>**දුක් විඳින සේවකයාණන් තුළින් දිවිමග සවිමත් කර ගනියි.** | 11.1.4 **දුක් දැරීම** (**ජෝබ්** 1 **පරි.**, **ජෙරමියා** 38,)<br>**සේවකත්වය**<br>(**යෙසායා** 52:13-53:12<br><br>**යෙසායා** 42: 1-4) | • දුක් විඳිමට මුහුණ දුන් සේවකයන් පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• දේව සේවයේ දී දුක් පීඩාවන්ට මුහුණ දීමට සිදුවන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• දුක් කරදරවලට එඩිතර ව මුහුණ දෙයි.<br>• සාමූහික ව නොපසුබට ව දේව සේවයේ යෙදෙයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 02.<br>**ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.** | 11.2.1<br>**කිතුනු ප්‍රේමයේ පදනම මත ජීවිතය ගොඩ නගා ගනියි.** | 11.2.1 **ප්‍රේමය**<br>**(1 කොරින්ති 13, පිලිප්පි, 2:1-2, එපීස 3:17-19, ශු. මාක් 12:29-33)** | • කිතුනු ප්‍රේමය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• ප්‍රේමය කිතුනු ජීවිතයේ පදනම බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• සැමට ප්‍රේමය දක්වයි.<br>• ප්‍රේමය පෙරදැරි කරගෙන සහයෝගයෙන් ජීවත් වෙයි. | 2 |
| | 11.2.2<br>**යුක්තිගරුක ව ජීවත් වෙමින් සාමය උදෙසා කැප වෙයි.** | 11.2.2 **සාමය**<br>**(ශු. මතෙව් 5:9-12, යෙසායා 9:6-7)**<br>**(යුක්තිය උදෙසා පීඩාවිඳි අය පිළිබඳව සඳහන් කරන්න.)** | • සාමය උදෙසා කැපවීම පිළිබඳව කරුණු ගොනු කරයි.<br>• යුක්තිගරුක බව තුළින් සාමය ඇතිවන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• සාමය ඇති කිරීමට කටයුතු කරයි.<br>• අයුක්තියට එරෙහිව සාමූහික ව ක්‍රියා කරයි. | 1 |
| | 11.2.3<br>**ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් ආදර්ශයට ගෙන කමාව දීමට නැඹුරු වෙයි.** | 11.2.3 **කමාව**<br>**(ශු. මතෙව් 6:12, 18:21-35, එපීස 4:32)**<br>**(කමාව ලබාදීම පිළිබඳව සමාජීය සත්‍ය සිදුවීම් සඳහන් කරන්න** | • කමාව දීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• කමාව දානය කළ යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• කමාව දීම දේව ගුණාංගයක් බව විශ්වාස කරයි.<br>• එකිනෙකාට කමාව දීමට නැඹුරු වෙයි. | 2 |
| | 11.2.4<br>**විවිධත්වය තුළ ඒකත්වයෙන් දිවි ගෙවයි.** | 11.2.4 **ඒකත්වය**<br>**(ශු.ජොහාන් 15:1-16, 17:20-23, ගලාති 3:28-29, එපීස 2:14-16, 4:16)** | • සදාතන ජීවනය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහීමෙන් සදාතන ජීවනය ලැබෙන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• දේව ගරු බියෙන් යුතු ව ජීවත් වෙයි.<br>• සදාතන ජීවනය පිළිබඳ ව අන් අයට ප්‍රකාශ කරයි | 2 |
| | 11.2.5<br>**ක්‍රිස්තුස් වහන්සේ තුළ සදාතන ජීවනයේ බලාපොරොත්තුව සඵලවත් කර ගනියි.** | 11.2.5. **බලාපොරොත්තුව හා සදාතන ජීවිතය**<br>**(පිලිප්පි 3:7-11, රෝම 5:1-6, 1 පේදුරු 1:13-21)** | • විවිධත්වය තුළ ඒකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• විවිධත්වය තුළ ඒකත්වයෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• සභා එකමුතුව උදෙසා යාච්ඤා කරයි.<br>• සභා එකමුතු ව සඳහා කටයුතු කරයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 03. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි. | 11.3.1<br>මුල් කිතුනු සභාවේ වටිනාකම් ආදර්ශයට ගනියි. | 11.3.1 මුල් කිතුනු සභාව<br>(ක්‍රියා 2:1-3, 37-47, 4:32-37, 5:12-16, 6:1-7) | ● මුල් කිතුනු සභාවේ වටිනාකම් පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>● දේව වචනය දේශනා කිරීමේ නිරත විය යුතු බව.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>● සමාජ සේවා කටයුතු වල නිරත වෙයි.<br>● සාමූහික ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි. | 2 |
| | 11.3.2<br>ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් එළදායී මෙහෙවරකට කැප වෙයි | 11.3.2 පේදුරුතුමාගේ සේවය<br>(ක්‍රියා 2:14-36, 3:1-10, 4:12-23, 10:1-33, 12:1-19) | ● පේදුරුතුමා කළ සේවය පිළිබඳව කරුණු ගොනු කරයි<br>● ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් එළදායී මෙහෙවරකට කැප විය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරයි<br>● සේවයේ අභියෝගවලට එඩිතර ව මුහුණ දෙයි.<br>● සමාජයෙහි විවිධ සේවාවන් හි යෙදෙයි. | 2 |
| | 11.3.3<br>පාවුල්තුමාගේ සිත් හැරීම ආදර්ශයට ගනියි. | 11.3.3 පාවුල්තුමාගේ පසුබිම හා සිත් හැරීම<br>(ක්‍රියා 7:57-60, 8:1-3, 9 පරි. 22:3-5, 27, 23:6) | ● පාවුල් තුමාගේ පසුබිම හා සිත් හැරීම පිළිබඳව කරුණු හදාරයි<br>● ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත පරිවර්ථනයක් අත් දැකිය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ලිපි රචනා කරයි<br>● ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත්දකියි.<br>● මිතුරන් උදෙසා එකමුතු ව යාච්ඤා කරයි | 2 |
| | 11.3.4<br>හවුල් නායකත්වය අනුගමනය කරයි | 11.3.4 පළමු ධර්ම දූත ගමන හා එහි ප්‍රතිඵල<br>(ක්‍රියා 13, 14 පරි. 15:135, 11:26, 12:25 ) | ● පාවුල් තුමාගේ පළමු ධර්මදූත චාරිකාවට අයත් නගරවලට අදාළ තොරතුරු පෙළ ගස්වයි.<br>● හවුල් නායකත්ව ය වැදගත් බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක පොත් පිංචක් සකසයි.<br>● ධර්ම දූත සේවය සඳහා කැප වෙයි.<br>● අන් අය හා එක් ව හවුල් සේවයක යෙදෙයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.3.5<br>නො පසුබට වීර්යයෙන් යුතුව සේවයේ යෙදෙයි. | 11.3.5<br>දෙවන ධර්මදූත ගමන<br>(ක්‍රියා 15:36-41, 16, 17, පරි., 18:1-23) | • පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට අදාල කරුණු ගොනු කරයි.<br>• නොපසුබට වීර්යයෙන් යුතු ව සේවය කළ යුතු බව පිළිගනියි.<br>• කතාවක් ඉදිරිපත් කරයි.<br>• ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කරයි<br>• අභියෝග හමුවේ නොපසුබට වීර්යයෙන් සේවය කරයි. | 3 |
| | 11.3.6<br>සේවයේ අභියෝග සඳහා අවස්ථානෝචිත ව ප්‍රතිචාර දක්වයි. | 11.3.6<br>තෙවන ධර්මදූත ගමන<br>එපීසය හා අවට නගර වෙත<br>(ක්‍රියා 18:24-21:19,) | • එපීසය අවට නගරවල පාවුල් තුමා කළ මෙහෙය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• සේවයේ අභියෝග ජය ගත යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• ධර්මදූත සේවයේ දී අභියෝග ජය ගනියි.<br>• සුහසුන අන් සමග බෙදා ගනියි. | 3 |
| | 11.3.7<br>එඩිතර ව සත්‍යයට සාක්ෂි දරයි. | 11.3.7 රෝමයට ගිය ගමන<br>(ක්‍රියා 25:10-11, 26:32, 27, 28 පරි.) | • පාවුල්තුමා රෝමයට ගිය ගමන පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• එඩිතර ව සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව පිළිගනියි.<br>• නාට්‍ය පිටපතක් රචනා කරයි.<br>• ධර්මදූත සේවය සඳහා කැඳවීමක් ඇත්දැයි විමසා බලයි.<br>• එඩිතර ව සාක්ෂි දරමින් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දෙයි. | 3 |
| 04.<br>දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායකවෙයි. | 11.4.1<br>ජේසුස් වහන්සේගේ ප්‍රේමය අත්දකිමින් තම ජීවිතය ආලෝකවත් කර ගනියි. | 11.4.1 ක්‍රිස්තුස් වහන්සේ හා මම<br>(ශු. ජොහාන් 3:1-15, 4:7-10 පිලිප්පි 2:5, 16) | • නිකදේමුස් හා සමාරිය ස්ත්‍රිය ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අත්දුටු ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීම තුළින් අපගේ ජීවිත ආලෝකවත් වන බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකමෙහි නිරත වෙයි<br>• ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්ප අනුගමනය කරයි.<br>• එකිනෙකා සමඟ ප්‍රේමයෙන් ජීවත් වෙයි. | 2 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.4.2<br>ක්‍රිස්තුස් වහන්සේ සමග ගැඹුරු සබඳතාවයකට ඇතුළු වෙමින් පවුල හා සමාජය ගොඩ නැගීමට දායකවෙයි. | 11.4.2 ක්‍රිස්තුස් වහන්සේ තුළ පවුල<br>(උත්පත්ති 2:18-25,<br>කොලොස්සි 3:18-21, එපීස 5:21-6:4)<br>ක්‍රිස්තුස් වහන්සේ තුළ සමාජය<br>(කොලොස්සි 3:12-17, ශු. මතෙව් 25:31-46, තීතස් 3:1-2,<br>ජාකොබ් 2:1-4, ධර්මදේශකයා 5:8) | • කිතුනු පවුලේ හා සමාජයේ යුතුකම් හා වගකීම් පිලිබඳ කරුණු ගොනු කරයි.<br>• දේව ගරුබිය ඇතුව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි<br>• දෙමාපියන්ට කීකරු වෙයි.<br>• අන් අයගේ අවශ්‍යතාවයන් වල දී සංවේදීව ක්‍රියා කරයි. | 3 |
| | 11.4.3<br>සැම දෙන සමග සහජීවනයෙන් කටයුතු කරයි. | 11:4.3 සමාජ සබඳතා<br>(එපීස 4:6-16,<br>2 කොරින්ති 6:4-7:1) | • සහජීවනයෙන් කටයුතු කිරීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>• සත්‍ය කථා කළ යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක කථාවක් ඉදිරිපත් කරයි.<br>• යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට දායක වෙයි.<br>• සැම දෙන සමග සහජීවනයෙන් කටයුතු කරයි. | 2 |
| | 11.4.4<br>දේව මග පෙන්වීමෙන් යහපත් ජිවිත පුරුදු ඇති කර ගනියි. | 11.4.4 අයහපත් ක්‍රියාවලින් හා ඇබ්බැහිවීම් වලින් වැළකීම<br>(රෝම 12:1, හිතෝපදේශ 23:29-35, එපීස 4:25,<br>ගලාති 5:16-21) | • යහපත් ජීවිත පුරුදු ඇති කර ගත හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි<br>• ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම අනුව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක පෝස්ටරයක් ඉදිරිපත් කරයි.<br>• මාංශික තෘෂ්ණා අත්හරියි.<br>• සමාජයේ යහපත ඉටු කිරීමට යොමු වෙයි. | 2 |
| | 11.4.5<br>දරිද්‍රතාව පිටු දැකීමට අත හිත දෙයි | 11.4.5 දරිද්‍රතාව<br>(ශු. ලූක් 18:18-30,<br>ශු. මතෙව් 6:11, 19-21, 22:13,<br>හිතෝපදේශ 26:13-15, 6:6-11,<br>ක්‍රියා 6:1-2<br>2 කොරින්ති 8: 1-5,<br>ශු. ලූක් 16:19-31) | • දරිද්‍රතාවය පිළිබඳ කරුණු ගොනු කරයි<br>• දරිද්‍රතාවය පිටු දැකීමට අත හිත දිය යුතු බව පිළිගනියි.<br>• නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>• කඩිසර ව කටයුතු කරයි.<br>• එකිනෙකාගේ අවශ්‍යතා සපුරාලීමට ක්‍රියා කරයි. | 3 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 11.4.6<br>පීඩිත වුවන් මුදවාලීමට ක්‍රියා කරයි | 11.4.6 ව්‍යසන හා හිංසා පීඩා<br>(නික්මයාම 2:23-25, 3:9, ශු. ලූක් 4:18, ජොහාන් 3:16)<br>(මෑත කාලීන නිදසුන් මගින් පාඩම පෝෂණය කරන්න.) | ● ව්‍යසන හා හිංසා පීඩා පිළිබඳ කරුණු ගොනු කරයි<br>● පීඩාවට පත් ජනතාවට සහනය සැලසිය යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● හිංසාව පිටු දැකීමට කටයුතු කරයි.<br>● පීඩාවට පත්වන ජනතාවට සහනය සැලසීමට සහයෝගයෙන් ක්‍රියා කරයි. | 3 |
| 05.<br>ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි. | 11.5.1<br>සාධාරණත්වය මත පදනම් වූ ජීවිතයක් ගත කරයි | 11.5.1 ආමොස්-සාධාරණත්වය,<br>(ආමොස් 4, 5 පරි.) | ● ආමොස් ඉදිරිපත් කළ යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ දේව පණිවුඩයට අදාළ කරුණු ගොනු කරයි<br>● සාධාරණ ව ජීවත්විය යුතු බව පිළිගනියි.<br>● විවාදයක් පවත්වයි.<br>● යුක්තිගරුක ව ජීවත් වෙයි. | 2 |
| | 11.5.2<br>පිවිතුරු ජීවිතයක් ගත කිරීමට දේව මග පෙන්වීම ලබයි | 11.5.2 යෙසායා-පාරිශුද්ධත්වය,<br>(යෙසායා 6 පරි.) | ● යෙසායාගේ කැඳවීම හා සේවය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.<br>● පිවිතුරු ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනියි.<br>● නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.<br>● පව් වලට මනස්ථාපනය වෙයි.<br>● පිවිතුරු ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම අන් අයට ප්‍රකාශ කරයි. | 2 |
| | 11.5.3<br>සාමය ඇති කිරීමට දායක වෙයි. | 11.5.3 මීකා - සාමකාමීත්වය,<br>(මීකා 4 පරි.) | ● දිවැසිවර මීකාගේ සාමයේ පණිවිඩ පිළිබඳ කරුණු ගොනු කරයි.<br>● සාමයෙන් දිවි ගෙවිය යුතු බව පිළි ගනියි.<br>● පෝස්ටරයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>● සාමය ඇති කිරීමට ක්‍රියා කරයි.<br>● සාමකාමී ලොවක් ගොඩනැගීමට එකමුතුව දායක වෙයි. | 2 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 11.1.1** : ජුදෙව් සමාජ දර්ශනය පිළිබඳ ගැඹුරින් හදාරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ජුදෙව් සමාජ දර්ශනය පිළිබඳ කරුණු ගොනු කරයි
- දේව කැඳවීමට ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- යහපත් කිතුනු වටිනාකම් වර්ධනය කර ගනියි.
- දස පනත අනුව යහපත් සමාජයක් ගොඩ නැංවීමට ක්‍රියාකාරී වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- 'සමාජ දර්ශනය' යන මාතෘකාව හුණු පුවරුවේ ලියා අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ඒ ඒ සමාජයන් ට අනන්‍ය වූ සමාජ දර්ශනයන් ඇති බව.
  - ජුදෙව් සමාජයට ද දර්ශනයක් ගොඩ නැගීමට ආබ්‍රහම් මූලික වූ බව.
  - දස පණත ජුදෙව් සමාජ දර්ශනය පෝෂණය කළ බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - ජුදෙව් සමාජ දර්ශනයේ අග්‍ර ස්ථානය දෙවියන් වහන්සේ බව.
  - ජුදෙව් සමාජයේ ද යහපත් වටිනාකම් තිබූ බව.
  - ඊශ්‍රායෙල් ඉතිහාසයේ ආරම්භය ආබ්‍රහම් කැඳවීම බව. (උත්පත්ති 12:2-3)
  - දේව සම්බන්ධතාවය මගින් සමාජ දර්ශනය පෝෂණය වූ බව. (උත්පත්ති 18:1-15)
  - ඉශ්‍රායෙල් වරුන් අන් අයට ආශිර්වාදයක් වීම, ජුදෙව් සමාජ දර්ශනයේ කැපී පෙනෙන බව. (යෙසායා 19:25, ද්විතීය 7: 6-8)
  - දස පණත යහපත් සමාජයක් ගොඩ නැගීමට උපකාර වූ බව. (නික්මයාම 20, ලෙවී 25)
  - කිතුනු වටිනාකම් තුළින් සමාජය පෝෂණය කළ යුතු බව.
  - දේව සම්බන්ධතාවය මුල් කර ගනිමින් සමාජ දර්ශනය ගොඩ නැගීම.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -උත්පත්ති 12:2-3, 18:1-15, ද්විතීය 7:6-8, ලෙවී 25,
යෙසායා 19:25, 45:1-4, නික්මයාම 20, ජෙරමියා 29 : 5-7
ඒ 4 කඩදාසි
පාට පැන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

උත්පත්ති 12: 2-3, 18:1-15, නික්මයාම 20 කියවන්න.

ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ආබ්‍රහම්ගේ කැඳවීම හා දස පනතින් පෝෂණය වූ සමාජ දර්ශනය යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

2 කණ්ඩායම

ලෙවී 25, යෙසායා 19:25, 45:1-4, ජෙරමියා 29:5-7, ද්විතීය 7:6-8 කියවන්න.

ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.

'ජුදෙව් සමාජ දර්ශනය' තුළින් මතු වන සමාජ වටිනාකම් යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

**ගෙදර පරිසරයෙන්**

දස පණත කටපාඩම් ක්‍රියාවට නැංවීමට හුරු කරවන්න

**නිපුණතාව 11.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 11.1.2** : මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක් ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- මෙසියානු සංකල්පය පිළිබඳව කරුණු ගොනු කරයි.
- මෙසියස් වහන්සේ සාමයේ කුමාරයාණෝ බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් වල යෙදෙයි.
- මෙසියස් වහන්සේ තුළින් ජීවිත ආලෝකය අත්දකියි.
- යුක්තිය හා ධර්මිෂ්ඨකම වෙනුවෙන් සාමූහික ව කැප වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ලියලන නව දල්ලක් සහිත අත්තක් ප්‍රදර්ශනය කරන්න.
- යෙසායා 11:1 හුණු පුවරුවේ ලියා එය සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.
  - නව දල්ලකින් නව උපතක්/යුගයක්/වර්ධනයක් සංකේතවත් වන බව.
  - ජුදෙව්වන් වහල් කමින් මිදී ආ ගමනේ නිමාව බලාපොරොත්තු වූ බව.
  - දාවිත්ගේ රජ පෙළපත වෘක්ෂයකට සමාන කර ඇති බව.
  - විමුක්තිය දෙන පිණිස රජ කෙනකු බිහි වන බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - මෙසියානු සංකල්පයේ සුවිශේෂත්වයක් ඇති බව. (යෙසායා 9:7)
  - ආබ්‍රහම්ට දුන් පොරොන්දුව අනුව මෙසියස් කෙනකු අපේක්ෂාවෙන් සිටීම. (යෙසායා 11:1)
  - මෙසියස් වහන්සේ දාවිත්ගේ පරපුරෙන් එන රජ කෙනකු බව.
  - එතුමාණෝ අසිරිමත් උපදේශකයාණෝ මෙන්ම සාමයේ කුමාරයාණෝ ද බව. (යෙසායා 9:6)
  - අන්ධකාරයේ සිටි සෙනග ආලෝකය අත්දැක පරිපූර්ණ ජීවිතයක් ලබන ආකාරය. (යෙසායා 9:7)
  - මෙසියස් වහන්සේ තුළින් යුක්තිය හා ධර්මිෂ්ඨකම පරිපූර්ණත්වයට පත් වූ බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ලියලන නව දල්ලක් සහිත අත්තක්
ශුද්ධ බයිබලය -යෙසායා 9:6/11:1-9,
ඒ 4 කඩදාසි
කතුරු

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

යෙයාසා 9:1-7/11:1-9, බයිබල් පාඨයන් කියවා සාකච්ඡා කර ජුදෙව්වන් අපේක්ෂා කළ මෙසියස් වහන්සේගේ ලක්ෂණ ඒ 4 කඩදාසියක ලියන්න.

2 කණ්ඩායම

යෙයාසා 9:1-7/11:1-9, බයිබල් පාඨයන් කියවා සාකච්ඡා කර 'වත්මන් සමාජය අපේක්ෂා කරන සාම රාජ්‍යය' පිළිබඳ ව නිර්මාණාත්මක පුවරුවක් සකසන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම විට ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 11.0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 11.1.3** : යහපත් එඬේර ගුණාංග චරිතායනය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- යහපත් එඬේරාණන්ගේ ගුණාංග පිළිබඳ කරුණු ගොනු කරයි
- දෙවියන් වහන්සේ අපගේ එඬේරා බව පිළිගනියි.
- නිර්මාණාත්මක ලිපියක් ඉදිරිපත් කරයි.
- යහපත් එඬේරාගේ ගුණාංග චරිතායනය කරයි
- සැම හා එක් ව එඬේරික සේවාවට සහයෝගය දක්වයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සමාජයේදී යහපත් නායකයින් ලෙස ක්‍රියා කළ අයගේ පින්තූර කිහිපයක් ප්‍රදර්ශනය කරන්න. (ඉව්ලින් කාහි/මයිකල් රුදීගෝ පියතුමා/ ගරු ඇන්ඩෘ කුමාරගේ රදගුරු හිමිපාණන්/ගරු කෙනත් ප්‍රනාන්දු රදගුරු හිමිපාණන්/ නෙල්සන් මැන්ඩෙලා වැනි අයගේ)
- එම පුද්ගලයන් ගැන සිසුන් දන්නා අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.
  - ඔවුන් විශිෂ්ට නායකයින් හා එඬේරුන් ලෙස ක්‍රියා කළ බව.
  - විවිධ එඬේරුන් පිළිබඳ ව ශුද්ධ බයිබලයේ සඳහන් වන බව.
  - අපට ද එඬේරකු ලෙස ක්‍රියා කළ හැකි බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 35)

පියවර 3

- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - ස්වාමින් වහන්සේ අප සැමගේ එඬේරා ලෙස ක්‍රියා කරන බව. (ගීතා 23:1)
  - උන්වහන්සේ එඬේරකු ලෙස අපට පෝෂණය හා රැකවරණය ලබා දෙන බව. (එසකියෙල් 34:16)
  - නව ගිවිසුමේ එඬේරා ජේසුස් වහන්සේ බව. (ජොහාන් 10:17)
  - ජේසුස් වහන්සේ තම බැටළුවන් පුද්ගලිකව හඳුනන බව. (ජොහාන් 10:14)
  - යහපත් බැටළු එඬේරා තම බැටළුවන් උදෙසා දිවි පිදීම. (ජොහාන් 10:11)
  - විවිධ අවස්ථා වලදී අප ද අන් අයට එඬේරුන් ලෙස මග පෙන්වීම හා රැකවරණය දිය යුතු බව.
  - අප ද එඬේරුන්ගේ ආදර්ශය අනුගමනය කළ යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -එසකියෙල් 34/ගීතාඃ 23/ජොහාන්10ඃ7-19
සමාජයේ යහපත් නායකයින් ලෙස ක්‍රියා කළ අයගේ ඡායාරූප
ඒ 4 කඩදාසි
කතුරු
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් ඵල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ශු. බයිබලයේ එසකියෙල් 34, ගීතාවලිය 23, ජොහාන් 10ඃ7-19 කියවන්න.

ඒ පිළිබඳ මෙනෙහි කරන්න.

'වත්මන් සමාජයේ එඬේරික සේවාව පිළිබඳ ලිපියක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා පවුලේ නමස්කාරයේ දී ගීතාවලිය 23 භාවිතා කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 1:0** : දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.

**නිපුණතා මට්ටම 11.1:4** : දුක් විඳින සේවකයාණන් තුළින් දිවි මග සවිමත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දුක් විඳිමට මුහුණ දුන් සේවකයන් පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දේව සේවයේ දී දුක් පීඩාවන්ට මුහුණ දීමට සිදුවන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- දුක් කරදරවලට එඩිතර ව මුහුණ දෙයි.
- සාමුහික ව නොපසුබට ව දේව සේවයේ යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිනහා පිරි මුහුණක හා හඬන මුහුණක චිත්‍ර දෙකක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- එම මුහුණු දෙස බලා ඉන් පිළිඹිබු වන ධනාත්මක හා සෘණාත්මක ජීවිත අවස්ථාව එම චිත්‍ර දෙක මත ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මිනිසා දුක් විඳීම්වලට මුහුණ දෙන බව.
  - මිනිසුන් විවිධ ප්‍රතිචාර ඒ සඳහා දක්වන බව.
  - එම ප්‍රතිචාර සමහරක් ධනාත්මක වන අතර සමහරක් සෘණාත්මක බව.
  - කිතුනුවන්ට ද දුක් පීඩා පැමිණෙන බව.
  - ජේසුස් වහන්සේ දුක් පීඩා මැද සේවයේ නිරත වූ බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - ධර්මිෂ්ට හා දේව භය ඇති ඇදහිලිවතුන්ට ද දුක් විඳීමට සිදු වන බව. (ජෝබ් 1.1)
  - දෙවියන් වහන්සේ තුළ දුක් විඳීම අභිරහසක් වීම.
  - සියළු පිඩා මැද පව් කිරීමෙන් වැලකීමට ධෛර්යය ගත යුතු විම.( ජෝබ් 1:22)
  - දේව සේවකයන්ට ද දේව සේවය තුළ දී දුක් පීඩා පැමිණෙන බව

    ( ජෙරමියා 38ඃ 5-6)
  - දුක් පීඩා මැද සේවය කිරීමට ද කැඳවීම ලැබේ.(ජෙරමියා 38ඃ 1-7)
  - දුක් විඳින සේවකයන්ගේ දුක් දැරීමේ අසම සම බව (යෙසායා 53ඃ 1-8)
  - දුක් විඳින සේවකයාණන් ජේසුස් වහන්සේ බව.
  - ජේසුස් වහන්සේ සේවක නායකත්වයෙන් සේවය කිරීම.

- උන්වහන්සේ දිවි පිදීම දක්වාම ධෛර්යයෙන් යුක්තව ගමන් කිරීම.
- ජේසුස් වහන්සේගේ දුක් දැරීම තුළින්, දෙවියන් වහන්සේ ලොවට සුව සෙත උදාකර දුන් බව.
- කිතුනුවන් හා දේව සේවකයන් ලෙසට පීඩා තුළ ධෛර්යයෙන් ක්‍රියා කළ යුතු බව.
- කිතුනුවන් මුහුණ දෙන දුක් පීඩා තුළින් ජීවිතයට නව පන්නරයක් ලැබිය යුතු බව

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ජෝබ් 1 පරි, ජෙරමියා 38 පරි, යෙසායා 52: 13- 53: 12,42: 1-4
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
සිනහා පිරි මුහුණක හා හඬන මුහුණක චිත්‍ර
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ජෝබ් 1 පරිච්ඡේදය කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
'දේව භය ඇති ධර්මිෂ්ට ඇදහිලිවන්තයකු වූ ජෝබ් තමාට පැමිණි පීඩාවලට දැක්වූ ප්‍රතිචාර පිළිබඳව රචනාවක් ලියන්න.

2 කණ්ඩායම

ජෙරමියා 38 පරිච්ඡේදය කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
'දුක් පීඩාවලට ධෛර්යයෙන් මුහුණ දුන් දේව සේවක ජෙරමියා' යන මාතෘකාව යටතේ සඟරාවකට ලිපියක් ලියන්න.

3 කණ්ඩායම

යෙසායා 52 :13-53: 12, 42: 1-4 කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
'දුක් විඳින සේවකයාණන් වූ ජේසුස් වහන්සේ තුළින් ප්‍රකාශ වූ දේව ප්‍රේමය උතුම් බව' යන මැයෙන් රචනයක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දුක් වේදනා සතුටින් භාර ගැනීමට පුරුදු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2:1** : කිතුනු ප්‍රේමයේ පදනම මත ජීවිතය ගොඩ නගා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**
- කිතුනු ප්‍රේමය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- ප්‍රේමය කිතුනු ජීවිතයේ පදනම බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සැමට ප්‍රේමය දක්වයි.
- ප්‍රේමය පෙරදැරි කරගෙන සහයෝගයෙන් ජීවත් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1
- "ප්‍රේමය" යන වචනය පුවරුවක ලියා එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- "ප්‍රේමය" යන වචනයේ අර්ථය පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
- ඇමුණුම 2 සිසුන් අතට පත් කොට එය ගායනා කරන්න.
- ගීතිකාවට අනුව ප්‍රේමය පිළිබඳව අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ප්‍රේමය යනු පරිත්‍යාගයකි.
  - ප්‍රේමය ඉවසිලිවන්තය.
  - වෛරය නොමැති තැන ප්‍රේමය ඇති වේ.
  - ප්‍රේමය කරුණාවන්ත බව.

(මිනිත්තු 20)

පියවර 2
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - දේව ප්‍රේමය ක්‍රිස්තුස් වහන්සේ තුළින් සම්පූර්ණ වූ බව.
  - ප්‍රේමය සියල්ල උසුලන බව.
  - ඇදහිල්ල, බලාපොරොත්තුව, ප්‍රේමය සදහට ම පවතින ධර්මතා තුනකි.
  - එයින් ප්‍රධාන වන්නේ ප්‍රේමයයි. ( 1 කොරින්ති 13)
  - යාච්ඤාව තුළින් ප්‍රේමය ස්ථිර ලෙස පවත්වා ගත හැකි බව. (එපීස3: 17-19)
  - එකිනෙකා කෙරෙහි ආදරයෙන් හා දයාබරකමින් කටයුතු කිරීම.

- එක අරමුණකින් එක්සිත් ව සිටීමෙන් ප්‍රේමය සම්පූර්ණ වන බව. ( පිලිප්පි 2: 1-2).

- අපගේ මුළු සිතින්, බුද්ධියෙන් හා වීර්යයෙන් අපගේ දෙවි වූ ස්වාමින්ට ප්‍රේම කළ යුතු බව.

- තමාට මෙන් ම තම අසල්වැසියාට ද ප්‍රේම කිරීම. (මාක් 12: 33) (මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය 1 කොරින්ති 13, පිලිප්පි 2: 1-2, එපීස 3:17-18, මාර්ක් 12:29-33
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
කතුරු, ගම්, පාට වර්ග
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

.

1 කණ්ඩායම

1 කොරින්ති 13 පරිච්ඡේදය කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
ප්‍රේමය පිළිබඳ ශුද්ධ බයිබලයේ සඳහන් අදහස් පෙළ ගස්වන්න.

2 කණ්ඩායම

පිලිප්පි 2 : 1-2, එපීස 3 17-19 කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
කිතුනු ප්‍රේමය පිළිබඳව නිසඳැසක් කවියක් හෝ ගීතයක් නිර්මාණය කරන්න.

3 කණ්ඩායම

ශු. මාර්ක් 12 : 29-33 කියවන්න.
එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.
ප්‍රේමය පිළිබඳ ව සඳහන් වී ඇති ආඥා නිර්මාණාත්මක ව සකසන ලද පුවරුවල ලියා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

ඉවසිලිවන්ත ය කරුණාවන්ත ය
ප්‍රේමයෙ හැටි එය වේ
ක්‍රෝධය මානය වෛරය නොමැති ද
ප්‍රේමය එතැන රැඳේ

විනීත වේ උඩගු නොවේ
සිතේ නපුර නොමැතේ
අන් වරදේ සතුටු නොවේ
හරි දේ ගැන තුටුවේ

දිවැස් වැකී වුවද නැසී
දෙසූ දෙසුම් නිමවේ
ගුණ ද නැසී හඬ ද බිඳේ
ප්‍රේමය සදා දිළේ

**ගෙදර පරිසරයෙන්**

අන් අය සමග ප්‍රේමයෙන් කටයුතු කිරීමට හුරු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2.2 :** යුක්තිගරුක ව ජීවත් වෙමින් සාමය උදෙසා කැප වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 01

**ඉගෙනුම් පල**

- සාමය උදෙසා කැපවීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- යුක්තිගරුක බව තුළින් සාමය ඇතිවන බව පිළි ගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සාමය ඇති කිරීමට කටයුතු කරයි.
- අයුක්තියට එරෙහිව සාමූහික ව ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- යුක්තිගරුක බව කඩවන අවස්ථා දැක්වෙන පුවත් පත් පින්තූර හා සිරස්තල කීපයක් පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට එය නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - යුක්තිය නොමැති තැන සාමය කඩවන බව.
  - ගැටුම නොමැති විට සාමය ඇතිවන බව.
  - අන් අයට සවන් දීම, අන් මත ඉවසීම තුළ සාමය ගොඩ නැගේ.
  - සාමකාමීව වෙසෙන තෙක් සාමය රඳා පවතී

(මිනිත්තු 5)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 15)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - සැම විටම සාධාරණ ලෙස කටයුතු කල යුතු බව
  - එමගින් යුක්ති ගරුක බව ඇති වන බව.
  - දේව පුත්‍රයාණන්ගේ රාජ්‍යය තුළ සාමයට කෙලවරක් නොමැත.
  - යුක්තිය හා ධර්මිෂ්ඨ කම රජකම් කරන බව.
  - යුක්තිය ඇති කිරීම සඳහා පීඩා විඳීමට සිදුවන බව.
  - යුක්තිය ඇති තැන සාමය ගොඩ නැගෙන බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - මතෙව් 5:9-12, යෙසායා 9: 6-7
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

.1. ශු. මතෙව් 5:9 -12 ට කියවා යුක්ති ගරුක භාවය හා සාමය පිළිබඳ සඳහන් අදහස් වෙන් වෙන්ව ලියා දක්වන්න.

2. යෙසායා 9:6-7 කියවා සාම රාජාණෝ පිළිබඳව සඳහන් අදහස් කෙටියෙන් පෙළ ගස්වන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සැම විට සාමකාමීව ජීවත් වීමට හුරු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2:3 :** ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් ආදර්ශයට ගනිමින් කමාව දීමට නැඹුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- කමාව දීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- කමාව දානය කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- කමාව දීම දේව ගුණාංගයක් බව විශ්වාස කරයි.
- එකිනෙකාට කමාව දීමට නැඹුරු වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පෙර පුහුණුවකින් යුතුව ඇමුණුම 2 සඳහන් දෙබස පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - තරහ ඇතිවූ විට වරදට යොමුවන බව
  - අප කමාව අයැද සිටිය යුතු බව.
  - අන් අයට කමා විය යුතු බව.
  - කමාව දීමෙන් පමණක් කමාව ලැබෙන බව.
  - අප නිතර ම ප්‍රේමයෙන් කටයුතු කළ යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 20)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - අපට වරද කළ අයට අප කමා කළාක් මෙන් අපගේ වරදට ද කමා වීම.
  - කමාව දානය කිරීමේ සීමාවක් නොමැත.
  - තමාගේ මුළු සිතින් ම කමා කළ යුතු ය.
  - කරුණාව දැක්වීම තුළින් කමාව දානය කළ යුතු වීම.
  - දයානුකම්පාවෙන් යුතු ව කමාව දැක්විය යුතු බව.
  - කමාව පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම්.
  - ක්‍රිස්තුස් වහන්සේගේ ඉගැන්වීම් අනුගමනය කරමින් අපද කමාව දීමට හුරුවිය යුතු වීම.
  - කමාව දීමෙන් සතුට, ප්‍රීතිය, නිදහස, සහනය අත්දැකිය හැකි බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු.මතෙව් 6:12, 18: 21-35, එපීස 4:32,
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ශු. මතෙව් 6:12, එපීස 4:32, මතෙව් 18: 21-26 කියවන්න.

එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

කමාව දීම පිළිබඳ නාට්‍ය පිටපතක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

අක්කා: අම්මේ මේ මල්ලී, මට ගහන්න එනවා.

මල්ලී: අම්මේ අක්කට කියන්න මගේ වැඩවලට අනවශ්‍ය විදිහට කරදර වෙන්න එපා කියලා.

අක්කා: මම කළේ මල්ලි කරපු වැරැද්දක් පෙන්වා දුන්නු එක

අම්මා: ඇති ඇති දෙන්නම ඔය වාදෙ නවත්වන්න. මම බලාගෙනයි හිටියේ, පුතේ , අක්කා අවැඩක් කළේ නැහැනේ. වරදක් දුටු තැන ඒක පෙන්වා දුන්නා.

අක්කා: අම්මේ මල්ලි වැරදි කරනවා මට බලාගෙන ඉන්න බැරි ව ගියා. අපට ඉරිදා පාසලෙ දී කියාදුන්නා වරද පෙන්වා දීමත්, වරද පෙන්වා දුන් විට එය පිළිගැනීමත් හොඳ ක්‍රියාවක් කියලා.

අම්මා : ඔව් පුතා අක්කා කියන්නේ ඔයාට වැඩිමහල් කෙනෙක්. එයා කළේ නිවැරදි දෙයක්. එයාගෙ හිත රිදවපු එක නම් වැරදියි.

(සියල්ල බලා සිටි පියා)

තාත්තා: වරදක් කළොත් කමාව ගන්න පුරුදුවෙන්න ඕනේ. දේව වචනයෙන් කියලා තියෙන්නෙත් එහෙමයි. ජේසුස් වහන්සේ සතුරන්ට කමාව දුන්න හැටි දන්නවා නේද?

**ගෙදර පරිසරයෙන්**

වරදට කමාව දීමට හුරු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2:4** : විවිධත්වය තුළ ඒකත්වයෙන් දිවි ගෙවයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- විවිධත්වය තුළ ඒකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- විවිධත්වය තුළ ඒකත්වයෙන් ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සභා එකමුතුව උදෙසා යාච්ඤා කරයි.
- සභා එකමුතු ව සඳහා කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පෙර සූදානම් කරන ලද සිසුන් කිහිප දෙනකු ලවා එකම ගීතයක් සංගීත භාණ්ඩ කීපයක් යොදා එකට වාදනය කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - විවිධ වූ භාණ්ඩ සියළු දෙනා එක්ව වාදනය කිරීමෙන් ගීතයේ තනුව නිවැරදිව ඉදිරිපත් වූ බව.
  - සංගීත භාණ්ඩ විවිධ වුවත් එයින් නිකුත් වූ හඬ ඉතා අලංකාර බව.
  - විවිධ වුවත් කැපවීමෙන් එක් වීම තුළ යම් කාර්යයක් සාර්ථක කර ගත හැකි බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
- ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලෝම ඒකත්වයෙන් සිටිය යුතු බව
- ක්‍රිස්තුස් වහන්සේ තුළ ඒකත්වය (ජොහාන් 15:1-4)
- ක්‍රිස්තුස් වහන්සේ තුළ පල දැරීම (ජොහාන් 15:5-7).
- සියලු දෙනා ඒකත්වයක් වෙන පිණිස යාච්ඤාව. (ජොහාන් 17:20-23)
- භේද වලින් තොරව ඒකත්වය (ගලාති 3:28-29, එපීස 2:14-16).
- සභාව නැමති ශරීරයේ හිස ක්‍රිස්තුස් වහන්සේ බව.
- එහි අවයව වන අපි ඒකාබද්ධ ව ක්‍රියා කළ යුතු බව.
- අප ද භේදයකින් තොර ව එකමුතු ව ක්‍රියා කල යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ශු. ජොහාන් 15 :1-16, 17: 20-23, ගලාති 3: 28-29, එපීස 2: 14-16
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ජොහාන් 15:1-16 කියවන්න.

එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.

විවිධත්වය තුළ ඒකත්වය පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරන්න

2 කණ්ඩායම

ජොහාන් 17:20-23 හා ගලාති 3:28-29 කියවන්න.

එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.

විවිධත්වය තුළ ඒකත්වයෙන් කටයුතු කිරීම පිළිබඳ කෙටි වාර්තාවක් ලියන්න.

3 කණ්ඩායම

එපීස 2:14-16, 4:16 කියවන්න.

එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.

විවිධත්වය තුළ ඒකත්වයෙන් දිවි ගෙවමු යන මාතෘකාව යටතේ කිතුනු සඟරාවකට ලිපියක් ලියන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සහයෝගයෙන් දිවි ගෙවීමට හුරු කරවන්න.

**නිපුණතාව 2:0** : ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.

**නිපුණතා මට්ටම 11.2:5** : ක්‍රිස්තුස් වහන්සේ තුළ සදාතන ජීවනයේ බලාපොරොත්තු සඵලවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- සදාතන ජීවනය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහීමෙන් සදාතන ජීවනය ලැබෙන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- දේව ගරු බියෙන් යුතු ව ජීවත් වෙයි.
- සදාතන ජීවනය පිළිබඳ ව අන් අයට ප්‍රකාශ කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුන් අතට ලබාදී ගායනා කිරීමට අවස්ථාව සලසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - ගීතයේ සදාතන ජීවනය පිළිබඳ ව සඳහන් වන බව
  - ජේසුස් වහන්සේගේ කුරුසිපත්වීම හා උත්ථානය කිතුනු ජීවිතයේ වැදගත්කම කේන්ද්‍රස්ථානය බව.
  - සදාතන ජීවිතය පිළිබඳ ව බලාපොරොත්තුවක් කිතුනුවාට ඇති බව.
  - සදාතන ජීවනය ලැබීම සඳහා ඇදහිල්ල අවශ්‍ය බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ක්‍රිස්තුස් වහන්සේ දැනගැන්ම කිතුනු ජීවිතයට අවශ්‍ය බව (පිලිප්පි 3:7)
  - ක්‍රිස්තුස්වහන්සේ සමග කිට්ටු සබඳතාවයක් පවත්වා ගැනීම අවශ්‍ය බව (පිලිප්පි 3:9 )
  - ක්‍රිස්තුස් වහන්සේ ගේ කුරුසි පූජාව කෙරෙහි ඇදහීමෙන් සදාතන ජීවනය හිමි කර ගත හැකි බව. (පිලිප්පි 3:10)
  - අනාගතයේ දී ලැබෙන මෙම දේව මහිමතාවය ගැන ප්‍රීති විය යුතුය.(රෝම 5:2)
  - පීඩා මැද පවා, බලාපොරොත්තුවෙන් සිටීමට ශුද්ධාත්මයාණන්ගේ ප්‍රේමය ප්‍රදානය කරන අයුරු (රෝම 5:5)

- සදාතන ජීවනය ලැබීම සඳහා දේව ගරු බියෙන් හා ශුද්ධව ජීවත් විය යුතු බව.

(1 පේදුරු 1 ፡ 14-17)

- ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරි පූජාව පමණක් සදාතන ජීවනයට මාර්ගය විවර කරන බව. (1 පේදුරු 1:18)
- ක්‍රිස්තුස් වහන්සේ තුළ යහපත් හැසිරීමෙන් දිවි ගෙවිය යුතු බව.
- සදාතන ජීවනය පිළිබඳව බලාපොරොත්තුව අප තුළ පැවතිය යුතු බව.
- එම බලාපොරොත්තුව අන් අයට ප්‍රකාශ කළ යුතු බව

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - පිලිප්පි 3:7-11, රෝම 5:1-6, 1 පේදුරු 1:13-21
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

පිලිප්පි 3: 7-11, රෝම 5:1-6, 1 පේදුරු 1:13-21 කියවන්න.

එම කරුණු පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙය වන්න.

එම බයිබල් පාඨයන් ඇසුරෙන්, සදාතන ජීවනය ලැබීම සඳහා කිතුනු සිසුවකු සතු විය යුතු ගුණාංග ලැයිස්තු ගත කරන්න.

ක්‍රිස්තුස් වහන්සේ සමග කිට්ටු සබඳතාවයක් පවත්වා ගැනීම නිසා ඔබ ලද අත්දැකීමක් ලියා ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

1 කුරුසේ ළඟ මෙ මා
ජේසුස්නි රැක දෙන්
ජීවනේ පැන් එයි ගලා
කල්වරියේ කන්දෙන්

2 කුරුසේ ළඟ බියෙන්
මා සිටි අතර
පෙම් කුළුණු මා මිදී
දෙව් කැලුම් විහිදී

කුරුසේ කුරුසේ
වෙයි මගේ පැතීම
තොස් යුත් ආත්මය මගේ
ලොවින් යන තෙක්ම

3 කුරුසේ ළඟ ඇති
විස්ම පත් දේ දක්නෙම්
මේසපොව් උතුමෙනි
ඒ සෙවණක් කරන්

4 කුරුසේ දෙස බලම්
සදා ඇදහිල්ලෙන්
එතර රන් වෙරළ
පිවිසෙන තෙක් ම

**ගෙදර පරිසරයෙන්**

දේව ගරු බියෙන් යුතු ජීවිතයක් ගත කිරීමට මග පෙන්වන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:1** : මුල් කිතුනු සභාවේ වටිනාකම් ආදර්ශයට ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් ඵල**

- මුල් කිතුනු සභාවේ වටිනාකම් පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- දේව වචනය දේශනා කිරීමේ නිරත විය යුතු බව.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සමාජ සේවා කටයුතු වල නිරත වෙයි.
- සාමූහික ව දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් සම්බන්ධ වී සිටින කිතුනු සභාවන් පිළිබඳ ව හඳුන්වා දීමක් සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව සලසන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - කිතුනු ආගමිකයන් එක්වන්නේ කිතුනු සභාව තුළ බව.
  - කිතුනු සභාව තුළින් ලෝකයට සේවාවන් සිදුවන බව.
  - විවිධ නිකායන් පැවතිය ද අදහන්නේ එකම ස්වාමින් වහන්සේ බව.
  - සභාව තුළින් ලෝකයට ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ වන බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - මුල් කිතුනු අනුගාමිකයන් ශුද්ධාත්ම දානය ලබා එක්සිත් ව විසීම (ක්‍රියා 2:13)
  - මනස්ථාපනය වී පව්කමාව ලබන පිණිස ජේසුස් වහන්සේගේ නාමයෙන් බෞතිස්ම ලැබීම (ක්‍රියා 2:38, 41)
  - ඉගැන්වීම, ඉගෙනීම, රොටි කැඩීම, සහභාගීත්වය හා යාච්ඤාවේ නිරතුරුව යෙදී සිටීම. (ක්‍රියා 2:42)
  - තමන් සතු දේ පොදුවේ තබා ගැනීම (ක්‍රියා 2:45, 4:34-37)
  - ශුද්ධාත්ම බලයෙන් බොහෝ පුදුම හා ලකුණු සිදුවීම. (ක්‍රියා 2:43)
  - දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් සියල්ලන්ගේ ප්‍රසාදය ලබමින් ජීවත් වීම.

(ක්‍රියා 2:47)

- සභාව දිනපතා ම වර්ධනය වූ බව. (ක්‍රියා 2:47)
- මුල් සභාව ක්‍රිස්තුස් වහන්සේගේ පුනරුජ්ජීවනයට ප්‍රබල ලෙස සාක්ෂි දැරීම. (ක්‍රියා 4:33)
- දේව වචනය දේශනා කිරීම හා සමාජ සේවා කටයුතුවල නිරත වීම. (ක්‍රියා 6:2)
- යහපත් වූ ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වූ අය උපස්ථායකයන් ලෙසට පත් කිරීම. (ක්‍රියා 6:3)
- දේව වචනය ප්‍රකාශ කළ යුතු බව.
- සමාජ සේවා කටයුතුවල නිරත විය යුතු බව.
- මුල් කිතුනු සභාවේ වටිනාකම් ආදර්ශයට ගත යුතු බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය - ක්‍රියා 2:1-3, 37-47, 4:32-37, 5:12-16, 6:1-7)
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1,

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ක්‍රියා 2:1-3, 37-47, 4:32-37, 5:12-16, 6:1-7) කියවන්න.

1 කණ්ඩායම - මුල් කිතුනු සභාවේ වටිනාකම් හඳුනා ගනිමින් ඒවා පෙළ ගස්වන්න.

2 කණ්ඩායම - මුල් කිතුනු සභාව සහනාධාර ලබා දීම සම්බන්ධව ක්‍රියා කළ ආකාරය පිලිබඳ ව සඟරාවකට ලිපියක් සකස් කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

සහනාධාර දීමේ කටයුතු සඳහා දායක වීමට යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:2 :** ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් එලදායී මෙහෙවරකට කැපවෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පේදුරුතුමා කළ සේවය පිළිබඳ ව කරුණු ගොනු කරයි
- ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් එලදායී මෙහෙවරකට කැප විය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරයි
- සේවයේ අභියෝගවලට  එඩිතර ව මුහුණ දෙයි.
- සමාජයෙහි විවිධ සේවාවන් හි යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන්ට කඩදාසි හා පෑන් ලබා දී පේදුරු තුමා පිළිබඳව සුභාරංචි ඇසුරින් දන්නා දෙයක් ලියා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - සීමොන් පේදුරු ධීවරයකු බව.
  - පේදුරුතුමා ශ්‍රාවක කණ්ඩායමේ නායකයා බව.
  - ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණන් ලෙස ඔහු හඳුනා ගෙන සිටි අයුරු.
  - ජේසුස් වහන්සේ සෑම විශේෂ සේවාවක ට ම ඔහු කැඳවා ගෙන ගිය අයුරු.
  - පේදුරු තුමා ජේසුස් වහන්සේ නාඳුනන බව පැවසීම.
  - ජේසුස් වහන්සේ විශේෂ සේවාවන් පේදුරු තුමාට භාර කිරීම.
  - පේදුරු තුමා ජේසුස් වහන්සේට කැප වී සේවය කළ ආකාරය.
  - ඕනෑම අවස්ථාවක දී ජේසුස් වහන්සේට සේවය කිරීමට ඉදිරිපත් විය යුතු බව

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - ශුද්ධාත්මයාණන් වහන්සේ ගෙන් පූර්ණ වූ පසු පේදුරුතුමාගේ නිර්භීත භාවය (ක්‍රියා 2:14-16)
  - පේදුරු තුමාගේ දේශනා කිරීමේ සේවය. (ක්‍රියා  2:17-36)
  - පේදුරු තුමාගේ සුව කිරීමේ සේවය. (ක්‍රියා 3:1-10)
  - අභියෝග ඉදිරියේ නිර්භීත සේවය. (ක්‍රියා 4:12-2)

- අභියෝගාත්මක සේවයේ දී ප්‍රාතිහාර්ය අත්දැකීම (ක්‍රියා 12:1--19)
- ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් නිර්භීත ලෙස සේවය කිරීම කිතුනු වගකීම බව
- අභියෝග හමුවේ පසුබට නො විය යුතු බව
- සේවය සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ අප නිරතුරු ව ශක්තිමත් කරන බව.
- පේදුරු තුමා ආදර්ශයට ගනිමින් ඵලදායී මෙහෙයකට කැප විය යුතු බව.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය ක්‍රියා 2:14-36, 3:1-10, 4:12-23, 10:1-33, 12:1-19
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**
**ගවේෂණය සඳහා උපදෙස්**

කණ්ඩායම 1

ක්‍රියා 2: 14-36 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පේදුරු තුමා දේශනා කිරීම තුළින් කළ සේවයෙන් ආදර්ශයක් ලබමු" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරන්න

කණ්ඩායම 2

ක්‍රියා 3:1-10 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පේදුරු තුමාගේ සුවකිරීමේ සේවයෙන් මගපෙන්වීමක් ලබමු" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරන්න

කණ්ඩායම 3

ක්‍රියා 4:12-23, 12:1-19 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පේදුරු තුමාගේ අභියෝගාත්මක සේවයෙන් දිවියට අභියෝගයක් ලබමු" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරන්න

කණ්ඩායම 4

ක්‍රියා 10:1-33 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පේදුරු තුමාගේ විජාතීන් අතර කළ සේවය අනුගමනය කරමු." යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

වැඩිහිටි,ළමා නිවාසයක යම් සේවයක් කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3.3** : පාවුල් තුමාගේ සිත් හැරීම ආදර්ශයට ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- පාවුල් තුමාගේ පසුබිම හා සිත් හැරීම පිළිබඳ ව කරුණු හදාරයි
- ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත පරිවර්තනයක් අත් දැකිය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ලිපි රචනා කරයි
- ක්‍රිස්තුස් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත්දකියි.
- මිතුරන් උදෙසා එකමුතු ව යාච්ඤා කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- නම් නොකරන ලද පාවුල් තුමා දැක්වෙන පින්තූරයක් සහිත බ්‍රිස්ටල් බෝඩ් එකක් හුණු පුවරුව මත ප්‍රදර්ශනය කරන්න.
- පහත සඳහන් ශුද්ධ බයිබල් පාඨ සිසුන් අතර බෙදා දෙන්න
  ක්‍රියා 21:39. 22:2, 22:3බී, 26:5, 8:3,
- එම ශුද්ධ බයිබල් පාඨ කියවා එහි සඳහන් එක් කරුණක් පාවුල් තුමාගේ පින්තූරය සහිත බ්‍රිස්ටල් බෝඩ් එක මත ලියා දැක්වීම සඳහා අදාළ සිසුන්ට පන්තිය ඉදිරියට ඒමට සලස්වන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පාවුල් තුමා ජුදෙව් ජාතිකයකු බව.
  - පාවුල් තුමා තාර්සස් හි උපත ලද බව
  - පාවුල් තුමා විවිධ භාෂා දැන සිටි බව
  - ගමාලියෙල් නම් ගුරුවරයා මගින් පාවුල් තුමා ව්‍යවස්ථාව ඉගෙන ගත් අයුරු.
  - පාවුල් තුමා පරිසිවරයකු බව.
  - පාවුල් තුමා මුලදී කිතුනු සභාවට පීඩා කිරීම
  - ඕනෑම පුද්ගලයකු ගැන හැදෑරීමේ දී ඔහුගේ ජීවිත පසුබිම වැදගත් බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු45)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - සාවුල් පාවුල් ලෙස ද හැඳින්වීම.
  - සාවුල්ගේ ජීවිත පසුබිම. (ක්‍රියා 22:3-5)
  - සාවුල් හෙවත් පාවුල්ට රෝම පුරවැසි භාවය හිමි වීම. (ක්‍රියා 22:27-28)
  - සාවුල් ජුදෙව් පරිසිවරයෙකු ලෙස ජුදා ආගමේ විශ්වාසයන්ට අනුගත ව සිටීම. (ක්‍රියා 23:6)

- ස්තේපන්ගේ මරණයට සාවුල් සාක්ෂි කරුවෙකු වීම (ක්‍රියා 7:57-58, 60)
- ස්තේපන් ට ගල් ගැසූ අයගේ ඇඳුම් සාවුල් විසින් බලා ගැනීම. (ක්‍රියා 7:59)
- සාවුල් ජෙරුසලමේ කිතුනු සභාවට පීඩා කිරීම (ක්‍රියා 8:1-3)
- කිතුනුවන්ට පීඩා කිරීමට දමස්කයට යන අතර සාවුල්ගේ සිත් හැරීම සිදුවීම (ක්‍රියා 9 පරිඃ)
- තමා අදහන දහමට විශ්වාසවන්ත ව සිටීම.
- ක්‍රිස්තුස් වහන්සේ හඳුනා ගැනීම තුළ ජීවිත වෙනසක් අත්දැකීමේ අවශ්‍යතාවය (මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ක්‍රියා 7:57-60, 8:1-3, 9 පරි. 22:3-5, 27-28, 23:6
නම් නොකරන ලද පාවුල්ගේ පින්තූරය.
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

කණ්ඩායම 1

ක්‍රියා 22:3-5, 27-28, 23:6 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පාවුල් වන මගේ ජීවිත පසුබිම" යන මාතෘකාවට අදාළ ව පාවුල් තුමා විසින් සිය මිතුරකුට යවනු ලබන ලිපියක් නිර්මාණය කරන්න.

කණ්ඩායම 2

ක්‍රියා 7:57-60, 8:1-3, 9:1-2 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"කිතුනුවන්ට පීඩා කළ මගේ අතීතය" යන මාතෘකාවට අදාළ ව පාවුල් තුමා විසින් සිය මිතුරකුට යවනු ලබන ලිපියක් නිර්මාණය කරන්න.

කණ්ඩායම 3

ක්‍රියා 9:3-21 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
"පුදුම අත්දැකීමක් හරහා සිත් හැරීමක්" යන මාතෘකාවට අදාළ ව පාවුල් තුමා විසින් සිය මිතුරකුට යවනු ලබන ලිපියක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

තම වැරදි වලට මනස්ථාපනය වෙමින් සිත් හැරීමක් ඇති කර ගැනීම සඳහා යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:4 :** හවුල් නායකත්වය අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- පාවුල් තුමාගේ පළමු ධර්මදූත චාරිකාවට අයත් නගරවලට අදාළ තොරතුරු පෙළ ගස්වයි.
- හවුල් නායකත්ව ය වැදගත් බව පිළිගනියි.
- නිර්මාණාත්මක පොත් පිංචක් සකසයි.
- ධර්ම දූත සේවය  සඳහා කැප වෙයි.
- අන් අය හා එක් ව හවුල් සේවයක යෙදෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - බාර්ණබස්, පාවුල් හා ජොහාන් මාක් හවුල් සේවයට වෙන් කළ බව.
  - සිලූකියෙන් නැව් නැග ධර්ම දූත සේවය සඳහා පිටත් වූ අයුරු.
  - හවුල් සේවකයන් ලෙස ඔවුන් කටයුතු කළ බව.
  - කිතු දහම පතුරුවාලන්නට හවුල් සේවකයන් ක්‍රියා කළ අයුරු.
  - රෝග සුව කරමින් අරුම පුදුම හාස්කම් කළ බව.
  - හවුල් සේවයේ යහපත් ප්‍රතිඵල අත් විඳිය යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - සිරියාවේ අන්තියෝකියේ සභාව (ක්‍රියා 11:26, 13:1)
  - ධර්ම දූත සේවයේ අවශ්‍යතාවය
  - ශුද්ධාත්ම මග පෙන්වීමෙන් බාර්ණබස් හා පාවුල් ධර්ම දූත මෙහෙයට වෙන් කිරීම(ක්‍රියා 13:2-3)
  - ධර්මදූත ගමන ඇරඹුම (ක්‍රියා 13:4)
  - සලමිසේ හවුල් සේවයට ජොහාන්, මාර්ක් එක්වීම (ක්‍රියා 13:5)
  - පාපස් හි හවුල් නායකත්වය (ක්‍රියා 13:6-12)
  - ජොහාන්, මාර්ක් හවුල් සේවයෙන් ඉවත් වීම. (ක්‍රියා 13:13)
  - පිසිදියේ අන්තියෝකියේ දී හවුල් සේවකයන්ගේ දේශනා (ක්‍රියා 13:14-52)
  - ඉකෝනියේ පීඩා සඳහා හවුල් නායකත්වයේ ප්‍රතිචාර (ක්‍රියා 14:1-7)

- ලුස්ත්‍රාවේ හවුල් සේවය (ක්‍රියා 14:8-18)
- පීඩා සඳහා ප්‍රතිචාර හා නැවත සිරියාවේ අන්තියෝකියට හැරී යාම .

(ක්‍රියා 14:19-28)

- ජෙරුසලමේ මන්ත්‍රණ සභාවේ දී හවුල් නායකත්වය තුළ ප්‍රතිඵල සමාලෝචනය කිරීම, (ක්‍රියා 15:1-35)
- කිතුනුවන් හවුල් සේවයේ යෙදීමේ වැදගත්කම.
- හවුල් නායකත්වයේ යහපත් ප්‍රතිඵල ලැබීම.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ක්‍රියා 11: 26, 12:25, 13, 14 පරිච්ඡේද, 15:1-35
ඒ 4 කඩදාසි
පාට පැන්සල්, මාකර් පෑන්
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1
## ගවේෂණය සඳහා උපදෙස්

ශුද්ධ බයිබලය හා පෙළ පොත ඇසුරෙන් පහත ක්‍රියාකාරකමේ නිරත වන්න.

"පාවුල්තුමාගේ ධර්මදූත ගමන සහ හවුල් සේවය" යන මාතෘකාව යටතේ පොත් පිංචක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

කිතු දහමේ අරුමය පවසන්නට
කිතු දම ලොව දස දෙස පතුරන්නට
සුදතුම් ඔවුන්ට පැවසූ විලසට
වෙන් කළේ පිරිසක් හවුල් සේවයට

බාර්ණබස් පාවුල් හා ජොහාන්
අන්තියෝකියේ සභාවේ සිටන්
සිලූකියෙන් ඇරඹූ නැව් ගමනින්
ගමන් කළේ කිතු දහම පතුරමින්

සිනගෝගයේ දෙව් දහම බෙදන්නයි
රෝග ඇති දනන් සුව කරලන්නයි
බාධක පීඩා සැම ජය ගන්නයි
හවුල් සේවයට දිරි ලැබ ගන්නයි

අරුම පුදුම හා හාස්කම් සැමා
කරමින් පතුරයි කිතු හිමිගෙ පෙමා
දිවා රෑ නො බලා දිරිය සවි දමා
හවුල් සේවයෙන් දෙවිඳු ට මහිමා

එකමුතු වී සේවයේ යෙදෙන්නේ
සහයෝගෙන් දිරියෙන් එක් වෙන්නේ
යහපත් ප්‍රතිඵල අත්කර ගන්නේ
සුදතුම් සවි ලැබ පෙරටම යන්නේ

**ගෙදර පරිසරයෙන්**

පවුලේ සැම හා එකතු වී අවශ්‍යතා ඇති අය වෙනුවෙන් යම් සේවයක යෙදීමට යොමු වන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:5 :** නො පසුබට වීර්යයෙන් යුතු ව සේවයේ යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් ඵල**
- පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට අදාළ කරුණු ගොනු කරයි.
- නො පසුබට වීර්යයෙන් යුතු ව සේවය කළ යුතු බව පිළිගනියි.
- අර්ථාන්විත කතාවක් ඉදිරිපත් කරයි.
- ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතු ව කටයුතු කරයි
- අභියෝග හමුවේ නො පසුබට වීර්යයෙන් සේවය කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1
- ඇමුණුම 2 සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - මිෂනාරි සේවයේ පදනම
  - මිෂනාරි සේවයේ වැදගත්කම
  - මිෂනාරි වරුන් ජීවිත පරිත්‍යාගයෙන් සේවය කළ අයුරු
  - මිෂනාරි වරුන්ගේ නො පසුබට වීර්යය නිසා වනගත ගෝත්‍රිකයින් අතර පවා සුබසුන ව්‍යාප්ත වීම
  - පේදුරු, පාවුල්, බාර්ණබස්, සීලස් ආදීන් කැපවීමෙන් සේවය කළ මිෂනාරිවරුන් බව

(මිනිත්තු 15)

පියවර 2
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3
- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - මත ගැටුම් අභිබවා මිෂනාරි සේවය ඉදිරියට ගෙන ගිය බව (ක්‍රියා 15:36-41)
  - පාවුල්ගේ දෙවන ධර්මදූත ගමනට කැපවීමෙන් එක්වූවන් (ක්‍රියා 15:40-41, 16:1-5)
  - ධර්මදූත සේවය සඳහා ශුද්ධාත්ම මග පෙන්වීම. (ක්‍රියා 16:6-10)
  - අභියෝග ජය ගැනීමට නො පසුබට වීර්යය - පිලිප්පිය (ක්‍රියා 16:11-40)
  - සුබසුන සාක්ෂාත් කිරීමට නො පසුබට වීර්යය - තෙසලෝනිකය හා බෙරියාව (ක්‍රියා 17:1-15)
  - ස්ථානෝචිත ප්‍රඥාවෙන් කිතු දහම ස්ථාපිත කිරීමට නො පසුබට වීර්යය ඇතන්ස් (ක්‍රියා 17:16-34)

- සම ජීවනෝපායන් හරහා සුබසුන ව්‍යාප්ත කිරීමට නොපසුබට වීර්යය - කොරින්තිය (ක්‍රියා 18:1-17)
- නොපසුබට වීර්යයෙන දෙවන ධර්මදූත චාරිකාව සමාප්ත කිරීම (ක්‍රියා 18:18-23)
- නොපසුබට වීර්යයෙන් යම් කාර්යයක් සමාප්තිය කරා මෙහෙයවීමේ වැදගත්කම
- සුබසුන ව්‍යාප්ත කිරීම සඳහා කිතුනුවන් ලෙස දිරියෙන් දායකත්වය දැක්වීමේ අවශ්‍යතාවය

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ක්‍රියා 15:36-41, 18:1-23, 16, 17 පරිච්ඡේද
දෙවන ධර්මදූත චාරිකාවට අයත් සිතියම
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ක්‍රියා 16:11-40 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
එම කොටස තුළ අඩංගු පාවුල් තුමාගේ දෙවන ධර්ම දූත චාරිකාවට අයත්, නගරය/ නගර හඳුනා ගෙන දී ඇති සිතියමෙ හි ලකුණු කරන්න.
එම නගරය, නගර තුළ පාවුල්තුමා නො පසුබට වීර්යයෙන් ඉටු කළ සේවය හා අප ලබන ආදර්ශ පිළිබඳ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයෙකු ඉදිරිපත් කරන්න.

2 කණ්ඩායම

ක්‍රියා 17:1-15 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
එම කොටස තුළ අඩංගු පාවුල් තුමාගේ දෙවන ධර්ම දූත චාරිකාවට අයත්, නගරය/නගර හඳුනා ගෙන දී ඇති සිතියමෙහි ලකුණු කරන්න.
එම නගරය, නගර තුළ පාවුල්තුමා නො පසුබට වීර්යයෙන් ඉටු කළ සේවය හා අප ලබන ආදර්ශ පිළිබඳ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයකු ඉදිරිපත් කරන්න.

3 කණ්ඩායම

ක්‍රියා 17:16-34 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
එම කොටස තුළ අඩංගු පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට අයත්, නගරය/ නගර හඳුනා ගෙන දී ඇති සිතියමෙහි ලකුණු කරන්න.
එම නගරය, නගර තුළ 'පාවුල්තුමා නො පසුබට වීර්යයෙන් ඉටු කළ සේවය හා අප ලබන ආදර්ශ පිළිබඳ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයෙකු ඉදිරිපත් කරන්න.

4 කණ්ඩායම

ක්‍රියා 18:1-17 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
එම කොටස තුළ අඩංගු පාවුල් තුමාගේ දෙවන ධර්මදූත චාරිකාවට අයත්, නගරය/ නගර හඳුනා ගෙන දී ඇති සිතියමෙහි ලකුණු කරන්න.
එම නගරය, නගර තුළ පාවුල් තුමා නො පසුබට වීර්යයෙන් ඉටු කළ සේවය හා අප ලබන ආදර්ය පිළිබඳ කථාවක් පැවැත්වීමට කණ්ඩායමෙන් සාමාජිකයකු ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

මිෂනාරි සේවය ඉතා උතුම් සේවයකි. දේව ප්‍රේමය මිෂනාරි සේවයේ පදනම වේ. පේදුරු, පාවුල්, බාර්ණබස්. සීලස් හා තිමෝතියස් වැනි අය සුබසුන ව්‍යාප්ත කිරීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙන් හා නොපසුබට වීර්යයෙන් දිරි දැරුවෝ වෙති. මේ කථාන්දරය ඔවුන් ගැන නොවේ. ඔවුන් සේම නො පසුබට වීර්යයෙන් ක්‍රිස්තු සුබසුන ව්‍යාප්ත කිරීම සඳහා දිරි දැරූ මිෂනාරි පවුල් කිහිපයක් ගැනයි.

මීට වසර පනහකට පමණ පෙර, තරුණ මිෂනාරි පවුල් පහක් දකුණු ඇමරිකාව බලා පිටත් වූයේ ජේසුස් වහන්සේ පිළිබඳ සුබසුන "ඕර්කා" නමැති වනාන්තර ගතව ජීවත් වන ගෝත්‍රිකයින්ට පිළිගන්වනු සඳහාය. මොවුන් ඉතා බිහිසුණු නො හික්මුණු ජන කොටසක් විය. ඔවුහු පිටස්තර අය කෙළෙසකවත් විශ්වාස නො කළ හ. මෙම මිෂනාරි වරුන් ඕර්කා වරුන්ට ක්‍රිස්තු සුබසුන පිළිගැන්වීම සඳහා නො පසුබට ව ඉදිරිපත් වූයේ ඹුවුන් ඉදිරියේ තිබූ ජීවිත අවධානම පවා නොතකාය.

පළමුකොට මෙම තරුණ මිෂනාරිවරු ඕර්කා වරුන්ගේ භාෂාව ඉගෙන ගත් අතර ඔවුන් දිවි ගෙවන වන ගත ප්‍රදේශවලට ගුවනින් ත්‍යාග පාර්සල් දමන ලදී. එහි ලියා තිබුණේ "අපි ඔබට ආදරය කරමු'' කියාය.

අවසානයේ ඕර්කා වරුන් මුණ ගැසීමේ අවස්ථාව උදා විය. තම භාර්යාවන් හා දරුවන් නගරයේ නවත්වා, මිෂනාරි වරුන් ඕර්කා වරුන්ගේ වන ගත ප්‍රදේශයේ කඳවුරු බැඳ ගන්නා ලදී. තමාගේ කඳවුරට පැමිණෙන ලෙස ඔවුන් ඕර්කා වරුන්ට ආරාධනා කළ අතර, ඔවුන්ට අවශ්‍ය වූයේ ඕර්කා වරුන් හා මිත්‍ර වී ඔවුන්ට සුබසුන පිළිගැන්වීමට ය.

නමුත් ඒ අවස්ථාව කෙදිනකවත් උදා නොවීය. ඒ අසල ගඟ ළඟ දී ඕර්කා වරුන්, මිෂනාරි වරුන් පස් දෙනා මරා දැමීය. ප්‍රේමය වෙනුවට බිය හා ක්‍රෝධය එදින ජය ගත්තේය. නමුත් මෙය ඒ කථාවේ අවසානය නොවීය.

මෙම සිදුවීම සිදු වී වසර කිහිපයකට පසු ඕර්කා වරුන් විසින් සුබසුන වැළඳ ගන්නා ලදී. තරුණ මිෂනාරිවරුන් පස් දෙනා මරා දැමූ ඕර්කා වරුන් කිතුනුවන් බවට පත්වී තම ගෝත්‍රයේ අන් අයට ද ජේසුස් වහන්සේ පිළිබඳව කියා දෙන ලදී. දෙවන වර ඔවුන්ට ජේසුස් වහන්සේ පිළිබඳ සුබසුන අසන්නට ලැබුනේ කෙසේද?

ඔබට සිතිය හැකිද?

ඕර්කාවරුන් විසින් මරා දමනු ලැබූ තරුණ මිෂනාරි වරුන් පස් දෙනාගේ භාර්යාවන් තම ජීවිත අවධානම ගැන නොතකා හා තම ස්වාමි පුරුෂයන්ට සිදුවූ දේ ගැන ද නොතකා නො පසුබට ව නැවත ඕර්කා වරුන් වෙත ගොස් ඔවුන්ට ජේසුස් වහන්සේගේ ආදරය ගැන ප්‍රකාශ කරන ලදී. ඔවුන්ගේ ප්‍රයත්නය සාර්ථක විය. ඕර්කා වරුන් එවර එම සුබසුන් පිළිගන්නා ලදී. මෙය නො පසුබට වීර්යයෙන් අති මහත් දේව ප්‍රේමයේ ඵල නෙළා ගැනීමක් විය.

**ගෙදර පරිසරයෙන්**

දේශයේ, ධර්ම දූත සේවය වෙනුවෙන් යාච්ඤා කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:6 :** සේවයේ අභියෝග සඳහා අවස්ථානෝචිත ව ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් ඵල**

- එපීසය අවට නගරවල පාවුල් තුමා කළ මෙහෙය පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- සේවයේ අභියෝග ජය ගත යුතු බව පිළිගනියි.
- පංති පුවත් පතක් නිර්මාණය කරයි.
- ධර්ම දූත සේවයේ දී අභියෝග ජය ගනියි.
- සුබසුන අන් සමග බෙදා ගනියි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 සිසුවකු ලවා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - පාවුල් තුමා හා සේවයට සීලස් ද හවුල් වූ බව
  - දෙවන ධර්ම දූත චාරිකාවේ දී ඔවුන්ට බොහෝ අභියෝග වලට මුහුණ දීමට සිදු වූ අයුරු
  - පාවුල් තුමාගේ තෙවන ධර්ම දූත චාරිකාව එපීසය වටා කේන්ද්‍ර ගත වන බව
  - අභියෝග ජය ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ පිහිට ලබා දෙන බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - පාවුල් තුමා සිය තෙවන ධර්ම දූත චාරිකාව සඳහා එපීසයට පැමිණීම. (ක්‍රියා 19-11)
  - එපීසය තුළ පාවුල් තුමා විවිධ අභියෝගවලට මුහුණ දී ජය ගැනීම
    ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ නියම ධර්ම මාර්ගය පහදා දීමේ අභියෝග ( ක්‍රියා 18:24-19:10)
    ජේසුස් වහන්සේගේ නාමය වැරදි ලෙස භාවිත කිරීම පරාජය කිරීමේ අභියෝගය ( ක්‍රියා 19:11-17)
    මිථ්‍යා මත හා රූප/ පිළිම නමස්කාරය වෙතින් මිනිසුන් වළක්වා ඉවතට ගැනීමේ අභියෝගය ( ක්‍රියා 19:18-41)
  - එපීසය අවට නගරවල පාවුල් තුමාගේ අභියෝගාත්මක ධර්ම දූත සේවය ( ක්‍රියා 20:1-21: 19)
  - කිතුනු මෙහෙවර තුළ පැන නගින අභියෝග බොහොමයක් ඇති බව.
  - කිතුනුවන් ලෙස සත්‍යයේ දහම් මාර්ගයට අවතීර්ණ වීමේ වැදගත් කම.
  - දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීමට යොමු වීම.

- අභියෝග ජය ගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ දිරිය හා සවිය ලැබීම.
- ජේසුස් වහන්සේ තුළ ස්ථිර ඇදහිල්ලෙන් දිවි ගෙවීම.

(මිනිත්තු 20)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය ක්‍රියා 18: 24- 21: 19
සුදු පැහැති විශාල කඩදාසි
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

1 කණ්ඩායම

ක්‍රියා 18: 24-19:10 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
කණ්ඩායමේ සෑම සාමාජිකයකුම " සත්‍යයේ මගට යොමු වෙමු" යන මාතෘකාව යටතේ ලිපිය බැගින් රචනා කරන්න.

2 කණ්ඩායම

ක්‍රියා 19:11-17 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
කණ්ඩායමේ සෑම සාමාජිකයකුම " දේව නාමයට ගරු කරමු" යන මාතෘකාව යටතේ ලිපිය බැගින් රචනා කරන්න.

3 කණ්ඩායම

ක්‍රියා 19:18-41 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
කණ්ඩායමේ සෑම සාමාජිකයකුම " එකම දෙවිඳුන් නමදිමු" යන මාතෘකාව යටතේ ලිපිය බැගින් රචනා කරන්න.

4 කණ්ඩායම

ක්‍රියා20: 1-21:19 දක්වා කියවන්න
ඒ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
කණ්ඩායමේ සෑම සාමාජිකයකු ම " සෑම අභියෝග ජය ගනිමු" යන මාතෘකාව යටතේ ලිපිය බැගින් රචනා කරන්න.

සියලු ලිපි එකතුවෙන් පන්ති පුවත් පතක් ක්‍රමවත් ව සාදන්න.
එය "නවෝදය" ලෙස නම් කරන්න.
තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

දිනපතා යාච්ඤාව හා දේව වදන් කියවීම මගින් අභියෝග ජය ගැනීමට හුරු කරවන්න.

## ඇමුණුම 2

මගේ නම සීලස්. මම පාවුල් හා සම්බන්ධ වුනේ දෙවන ධර්ම දූත චාරිකාවටයි. ක්‍රිස්තුස් වහන්සේගේ සුබසුන පතළ කරන්නට පාවුල් තුළ තිබූ උද්යෝගය වචනයෙන් විස්තර කළ නො හැකිය. පාවුල් දිවා රෑ නො බලා දෙවියන් වහන්සේට විශ්වාස වන්තව සේවය කළ කෙනෙක්. එසේ සේවය කිරීමේ දී පාවුල්ට මුහුණ දීමට තිබූ අභියෝග ඉතාම අධිකයි. පිලිප්පියේ දී සිර ගත වී කස පහර ලැබූ අතර, තෙසලෝනිකයේ එසේම බෙරියාවේ අත් දුටු අභියෝග පීඩන අති මහත්. මටත් එම අභියෝගවලට පාවුල් සමග හවුල් වීමට ලැබීම ඇත්තෙන්ම සතුටක්. ඇතන්ස්හිදී අන් දෙවි වරුන් අතර, ජේසුස් වහන්සේ හඳුන්වා දීමේ අභියෝගයට පාවුල් මුහුණ දුන් ආකාරය ප්‍රශංසනීයයි. දේව වචනය දේශනා කරමින් දෙවියන් වහන්සේ තුළ විශ්වාසයෙන් ඉදිරියට ගමන් කළත් අපේක්ෂා නො කරන විශාල අභියෝග වලටයි මුහුණ දීමට සිදුවන්නේ. එහෙත් දෙවියන්වහන්සේ නිරතුරුවම අප ළඟ සිටිමින්, එම අභියෝග වලට මුහුණ දී, ඒවායින් ජය ගැනීමට අපට ලබා දෙන සවිය දිරිය අතිවිශාලයි, පුදුමාකාරයි. මීළඟට අපගේ තුන්වන ධර්මදූත චාරිකාව කේන්ද්‍ර ගත වන්නේ එපීසය වටායි. එහිදී කුමක් සිදුවේදැයි දෙවියන්වහන්සේ පමණක් දන්නා සේක. එනමුත් සෑම අභියෝගයක්ම ජය ගැනීමට සහයදායකයාණන් වන ශුද්ධාත්මයාණන් වහන්සේ අපට නො අඩුවම පිහිට දානය කරන තැනැන් වහන්සේයි. එය අපේ එකම යැදුමයි. උතුම් ප්‍රාර්ථනාවයි.

**නිපුණතාව 3:0** : ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.

**නිපුණතා මට්ටම 11.3:7 :** එඩිතර ව සත්‍යයට සාක්ෂි දරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- පාවුල් තුමා රෝමයට ගිය ගමන පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- එඩිතර ව සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව පිළිගනියි.
- නාට්‍ය පිටපතක් රචනා කරයි.
- ධර්මදූත සේවය සඳහා කැඳවීමක් ඇත්දැයි විමසා බලයි.
- එඩිතර ව සාක්ෂි දරමින් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ශුද්ධාත්ම බලය තුළ තම ජීවිතවල අත් දැක ඇති මහත් දේ පිළිබඳ ව සිසුන් කිහිප දෙනකුගේ සාක්ෂි බෙදා ගැනීමට අවස්ථාව දෙන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
    - ජීවිත ගමනේ දී අපට විවිධ ප්‍රශ්න ගැටළු වලට මුහුණ දීමට සිදුවන බව.
    - ගැටළු ජය ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ අපට උපකාර කරන බව.
    - අපට විවිධ අයුරින් ජේසුස් වහන්සේ පිළිතුරු ලබාදෙන බව
    - ජේසුස් වහන්සේ අපට කර ඇති මහත් දේ පිළිබඳ ව අප සාක්ෂි දැරිය යුතු බව.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 65)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
    - පාවුල් රෝම අධිරාජයාගේ විනිශ්චය අයැදීම (ක්‍රියා 25:10-11, ක්‍රියා 26:32-27:1)
    - නැව් ගමන සහ ඒ අතරතුර සාක්ෂි දැරීම (ක්‍රියා 27 පරිච්ඡේදය)
    - මෝල්ටාවේ දී සාක්ෂි දැරීම (ක්‍රියා 28:1-10)
    - රෝමයේ දී සත්‍යයට සාක්ෂි දැරීම (ක්‍රියා 28:11-30)
    - අර්බුද මැද සාක්ෂි දැරීමේ අවශ්‍යතාවය
    - කිතුනුවන් එඩිතර ව සත්‍යයට සාක්ෂි දැරිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -ක්‍රියා 27 හා 28 පරිච්ඡේද, ක්‍රියා 25:10-11, 26:32
ඒ 4 කඩදාසි
කඩදාසි
මාකර් පෑන්
පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

කණ්ඩායම් 1, 2, 3

ක්‍රියා 25:10-11, 26: 32, 27 හා 28 පරිච්ඡේද කියවා මෙනෙහි කරන්න

ඒ පිළිබඳ ව කණ්ඩායමේ සාමාජිකයන් අතර සාකච්ඡා කරන්න.

ඒ ඇසුරෙන් ' එඩිතර ව සත්‍යයට සාක්ෂි දරමු' යන මාතෘකාව යටතේ නාට්‍ය පිටපතක් රචනා කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ගෙදර පරිසරයෙන්**

ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4:1** : ජේසුස් වහන්සේගේ ප්‍රේමය අත්දකිමින් තම ජීවිතය ආලෝකවත් කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- නිකදේමුස් හා සමාරිය ස්ත්‍රිය ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අත්දුටු ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කිරීම තුළින් අපගේ ජීවිත ආලෝකවත් වන බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකමෙහි නිරත වෙයි
- ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්ප අනුගමනය කරයි.
- එකිනෙකා සමග ප්‍රේමයෙන් ජීවත් වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් භාවනාවකට යොමු කරමින් ඇමුණුම 2 ගායනා කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - අපගේ ජීවිත දෙවියන් වහන්සේට භාර දිය යුතු බව
  - උන්වහන්සේ අප යහ මගට යොමු කරන ආකාරය.
  - උන්වහන්සේට අපගේ ජීවිත භාර දීම තුළින් අපට හිමිවන සහනය.

(මිනිත්තු 15)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
- නිකදේමුස් පරිසිවරයෙකි, යුදෙව්වෙකි ඉශ්‍රායෙල් හි ගුරුවරයෙකි.
- නිකදේමුස් ජේසුස් වහන්සේ හමු වීමට පැමිණීම.
- ජේසුස් වහන්සේ ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුලු වීමට හැකි අයුරු පැහැදිලි කල ආකාරය (ජොහාන් 3:1-15)
- ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ නව උපතක් අත්දැකිය යුතු බව.
- සමාරිය ස්ත්‍රිය ඒ පිළිබඳ ව ප්‍රශ්න කළ බව ( ජොහාන් 4: 7-10)
- ජේසුස් වහන්සේ ජීවන දායක ජලය බව( ජොහාන් 4: 10)
- ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්ප( පිලිප්පි 2 : 1-5)
- ක්‍රිස්තුස් වහන්සේ තුළ පැවති ආකල්ප අප තුළ ද පැවතිය යුතු බව

- අඳුරු ලොවක දීප්තිමත් තාරකාවක් මෙන් ක්‍රියා කළ යුතු ආකාරය

(පිලිප්පි 2:16)

- ජේසුස් වහන්සේගේ ප්‍රේමය අත්දකිමින් තම ජීවිත ආලෝකවත් කර ගත යුතු බව

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය - ජොහාන් 3:1-15, 4:7-10, පිලිප්පි 2:1-5, 16
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

ජොහාන් 3:1-15, 4:7-10, පිලිප්පි 2:1-5, 16 කියවන්න.

ඒ පිළිබඳ ව අනෙක් සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.

එම අදහස් ගොනු කරමින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ නිකදේමුස් ට සහ සමාරිය ස්ත්‍රියට ලබා දුන් විශේෂ පණිවිඩය කුමක්ද?

2. පිලිප්පි 2:1-5, 16 ට අනුව ඔබගේ ජීවිත කෙසේ හැඩ ගස්වා ගත යුතුද?

.3. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අත්දකිමින් අන් අය ඉදිරියේ ආලෝකයක් වීමට ඔබ තුළ තිබිය යුතු දේව රාජ්‍යයේ වටිනාකම් මොනවාද?

ලියන ලද පිළිතුරු පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

## ඇමුණුම 2

ඔබ කැමති දේ සාදන්න
කුම්භකරුනි මා මැටිය
හැඩ ගසන්න ඔබ සිත් සේ
භාර වෙමි මම් බලා සිටිමි

**ගෙදර පරිසරයෙන්**

එකිනෙකා සමග ප්‍රේමයෙන් යුතුව කටයුතු කිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4:2 :** ක්‍රිස්තුස් වහන්සේ සමග ගැඹුරු සබඳතාවයකට ඇතුළු වෙමින් පවුල හා සමාජය ගොඩ නැගීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් ඵල**

- කිතුනු පවුලේ හා සමාජයේ යුතුකම් හා වගකීම් පිළිබඳ කරුණු ගොනු කරයි.
- දේව ගරුබිය ඇතිව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි
- දෙමාපියන්ට කීකරු වෙයි.
- අන් අයගේ අවශ්‍යතා වල දී සංවේදී ව ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ඇමුණුම 2 ලබා දී විරිඳුව ගායනා කිරීමට සලස්වන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - පවුලේ නිර්මාතෘවරයාණෝ දෙවියන් වහන්සේ බව
  - මුල් මිනිස් යුවල ආදම් සහ ඒව බව.
  - පවුලක් ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කළ යුතු බව
  - පවුලේ යහපැවැත්ම සමාජයට ද බලපෑමක් ඇති කරන බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - දෙවියන්වහන්සේ මිනිසා තනිව විසීම සුදුසු නැති බැවින් ඔහුට සහකාරියක් මවා දුන් බව.
  - මිනිසාගේ ඉල ඇටයකින් ස්ත්‍රිය මවා මිනිසාට භාර දුන් බව.
  - කිතුනු පවුලේ සහ සමාජයේ යුතුකම් ඉටු කළ යුතු ආකාරය. (කොලොස්සි 3 : 12-21)
  - කිතුනු පවුලේ ස්වාමි පුරුෂයා, භාර්යාව හා දරුවන් කෙරෙහි පැවරෙන යුතුකම් හා වගකීම (එපීස 5:21-6:4)
  - කිතුනු දරුවකු වශයෙන් ජේසුස් වහන්සේ සමග ගැඹුරු සබඳතාවයකට යටත්ව පවුල හා සමාජය තුළ ක්‍රියා කළ යුතු ආකාරය.
  - තරාතිරම් නොබලා කටයුතු කිරීම. (ජාකොබ් 2:1-4)
  - ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කරමින් සමාජයේ ජීවත් විය යුතු ආකාරය

- අන් අයගේ අවශ්‍යතා වලට සංවේදී වීම. (ශු. මතෙව් 25 ෘ 31-46)
- ක්‍රිස්තුස් වහන්සේ තුළ සමාජයීය වගකීම (ධර්මදේශකයා 5:8)
- පාලකයන්ට කීකරු වීම (තීතස් 3:1-2)

(මිනිත්තු 25)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -උත්පත්ති 2:18-25, කොලොස්සි 3:18-21, එපීස 5:21-6:4.
කොලොස්සි 3:12-17, මතෙව් 25:31-46,, තීතස් 3:1-2,
ජාකොබ් 2:1-4, ධර්මදේශකයා 5:8
ඒ 4 කඩදාසි
පැන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

ඔබ කණ්ඩායමට දෙන ලද බයිබල් කොටස කියවා ඒ පිළිබඳව අනෙක් සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙය වන්න.

1 කණ්ඩායම

1. කොලොස්සි 3: 18-21, කොලොස්සි 3:12-17 ට අනුව කිතුනු පවුලේ හා කිතුනු සමාජය තුළ තිබිය යුතු යුතුකම් ලැයිස්තු ගත කරන්න.
2. එපීස 5 21-6:4 දක්වා කොටසට අනුව කිතුනු පවුලේ සාමාජිකයන් වන ස්වාමියා, පුරුෂයා, භාර්යාව හා දරුවන් සතු විය යුතු ගුණාංග පිළිබඳව ලැයිස්තුවක් පිළියෙල කරන්න.

2. කණ්ඩායම

ශු. මතෙව් 25: 31-46, තීතස් 3:1-12, ජාකොබ් 2 1-4, ධර්මදේශකයා 5:8 දක්වා කොටසට අනුව ක්‍රිස්තුස් වහන්සේ සමග ගැඹුරු සබඳතාවය තුළ සමාජයේ යහපත ඉටු කරමින් ජීවත්වීමට ඔබ ක්‍රියා කළ යුත්තේ කෙසේදැයි කරුණු පෙළ ගස්වන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## ඇමුණුම 2

**දෙවිඳේ ඔබ සමිඳේ**
**අප පවුලෙහි මුල අග වේ**

1. ලොව මුල් යුවල එකතු කරලා
ආදරයෙන් බැඳලා
ලොව පිරෙනා තෙක් නිතිනා
වසනට වර දුන්නා

2. මව් පිය රැකවරණය හැරලා
අඹු සැමි එකතු වෙලා
දිවි ගෙවනා බව කීවා

3. අඹු සැමි සැම එකිනෙකා හටා
ගරු කටයුතු ලෙසිනා
ප්‍රේමයෙනා දරුන් සදා
ඇති දැඩි කරමු සැමා

4. නාසරතෙහි ඒ පවුල මෙනා
දේව බියෙන් පිරිලා
කල් ගෙවනා ලෙස තුටිනා
ආසිරි යදිමු සැමා

**ගෙදර පරිසරයෙන්**

දයා සේවාවන් හි නිරත වීමට හුරු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4:3 :** සැම දෙන සමග සහජීවනයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් ඵල**

- සහජීවනයෙන් කටයුතු කිරීම පිළිබඳ ව කරුණු ගොනු කරයි.
- සත්‍ය කථා කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක කථාවක් ඉදිරිපත් කරයි.
- යහපත් සමාජ සම්බන්ධතා වර්ධනය කර ගැනීමට දායක වෙයි.
- සැම දෙන සමග සහජීවනයෙන් කටයුතු කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- පෙර සූදානමකින් යුතුව ඇමුණුම 2 ලබා දී ගායනා කිරීමට සිසුවකු සූදානම් කරන්න.
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - අප ජීවමාන දෙවිඳුන්ගේ මන්දිර බව
  - අප යහපත ඉටු කළ යුතු බව.
  - දෙවියන් වහන්සේ අප සමග වැඩ වසන බව
  - දෙවියන් වහන්සේට ගරු බිය දැක්විය යුතු බව
  - සිත කය කෙලෙසන ගති ලක්ෂණ මැඩලිය යුතු බව

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 25)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - සමාජ සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා දුක් පීඩා, අග හිඟකම් , විපත්ති මහත් ඉවසීමෙන් විඳ දරා ගත යුතු බව (2 කොරින්ති 6: 4)
  - දෙවියන් වහන්සේගේ සේවකයන් බව ඒත්තු ගැන්වීමට තිබිය යුතු කාරණා (2කොරින්ති 6: 6)
  - ධර්මිෂ්ටකම නමැති සන්නාහයෙන් සන්නද්ධව සිටීම ( 2 කොරින්ති 6: 7-10)
  - ඇදහිලිවන්තයකු ලෙස යහපත් සබඳතා පැවතිය යුතු බව (2කොරින්ති 6: 14-16)
  - අප එකිනෙකාට දී ඇති දීමනා සභාවේ වර්ධනයට භාවිත කළ යුතු බව (එපීස 4:15)
  - ප්‍රේමයෙන් යුතුව සමාජ සම්බන්ධතා වර්ධනය කර ගත යුතු බව
  - සැම දෙන සමග සහජීවනයෙන් කටයුතු කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -එපීස 4 :6-16, 2 කොරින්ති 6: 4- 7: 1
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1, 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

එපීස 4:6-16, 2 කොරින්ති 6:4- 7:1 කියවන්න

ඒ පිළිබඳව අනෙක් සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙය වන්න.

'ක්‍රිස්තු වහන්සේ තුළ ඒකාබද්ධ ශරීරයක් ලෙස සහජීවනයෙන් යුතුව ක්‍රියා කරමු'
යන මාතෘකාව යටතේ අවශ්‍ය කරුණු පෙළ ගස්වා කථාවක් ඉදිරිපත් කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**ඇමුණුම 2**

ජීවමාන දෙවිඳුගේ
මන්දිර වේ අප සැමා
එබැවින් අප සියළු දෙනම
සිතට ගනිමු මේ සැමා

අපගේ පිය දෙවි තුමා
අප සමගය සැම දිනා
දූ පුතනුන් ලෙසින් අපත්
ගරු බිය පාමු ව සදා

ප්‍රේමවන්ත දරුවනි
සිත කය කෙලෙසන ගති
මැඩලීමෙන් කටයුතු කර
ශුද්ධවන්ත වෙමු අපි

**ගෙදර පරිසරයෙන්**

නොගැළපෙන සම්බන්ධතා වලින් වැලකී සිටීමට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4:4 :** දේව මග පෙන්වීමෙන් යහපත් ජීවිත පුරුදු ඇති කර ගනියි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- යහපත් ජීවිත පුරුදු ඇති කර ගත හැකි ආකාරය පිළිබඳ කරුණු ගොනු කරයි
- ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම අනුව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක පෝස්ටරයක් ඉදිරිපත් කරයි.
- මාංශික තෘෂ්ණා අත්හරියි.
- සමාජයේ යහපත ඉටු කිරීමට යොමු වෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සමාජ විරෝධී ක්‍රියාවන්වල යෙදීම පිළිබඳ පුවත්පත් ශීර්ෂ පාඨ කිහිපයක් ඇතුලත් පෝස්ටරයක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - සමාජ විරෝධී ක්‍රියා නිසා බොහෝ දෙනා පීඩාවට ලක්වන බව
  - සමාජ විරෝධී ක්‍රියාවන්ට යොමු වීම නිසා නො පිළිගැනීමට ලක්වන අයුරු
  - සමාජයේ යහපත ඉටු කිරීමට යොමු විය යුතු ආකාරය

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - දුක, කාලකණ්ණිකම ඇතිවීමට හේතු විය හැකි කාරණා (හිතෝපදේශ 23:29-35)
  - සත්‍ය කථා කිරීම (එපීස 4:25)
  - ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ඇතිව හැසිරිය යුතු බව.(ගලාති 5:16)
  - මාංශික තෘෂ්ණා අත්හැරීම. (ගලාති 5:17-19)
  - මාංශික තෘෂ්ණා වල ඵල විපාක හඳුනා ගැනීම (ගලාති 5:19-21)
  - අපගේ ක්‍රියාවන් දෙවිඳුන් ඉදිරියේ පිළිගත හැකි වූ අයුරින් පවත්වා ගත යුතු බව. (රෝම 12:1)
  - යහපත් ජීවිත පුරුදු ඇතිකර ගත යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -රෝම 12:1, හිතෝපදේශ 23:29-35, එපීස 4:25, ගලාති 5:16-21
සමාජ විරෝධී ක්‍රියාවන් වල යෙදීම පිලිබඳ පුවත්පත් ශීර්ෂ පාඨ ඇතුලත් පෝස්ටරය
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

කණ්ඩායම 1

එපීස 4:25, ගලාති 5:16-21 කියවන්න

ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න

ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ඇතුව හැසිරීමට ඔබ අත්හැරිය යුතු කාරණා පෙළ ගස්වමින් පෝස්ටරයක් නිර්මාණය කරන්න.

කණ්ඩායම2

රෝම 12:1, හිතෝපදේශ 23:29-35 කියවන්න

ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න

'අයහපත් ඇබ්බැහිවීම් නිසා සමාජය මුහුණු දෙන ගැටලු' පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කරන්න

තම නිර්මාණ ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්**

විවිධ ඇබ්බැහි වීම් වලින් වැළකී සිටීමට යොමු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4.5 :** දරිද්‍රතාවය පිටු දැකීමට අත හිත දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් ඵල**

- දරිද්‍රතාවය පිළිබඳ කරුණු ගොනු කරයි
- දරිද්‍රතාවය පිටු දැකීමට අත හිත දිය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- කඩිසර ව කටයුතු කරයි.
- එකිනෙකාගේ අවශ්‍යතා සපුරාලීමට ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- හිතෝපදේශ 6: 6-11 කුහුඹුවාගේ පාඩම පුවරුවක සටහන් කොට පන්තියේ ප්‍රදර්ශනය කරන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න.
  - නැණවත්ව ක්‍රියා කළ යුතු බව
  - අලසකම අත්හැරිය යුතු බව
  - දිළිඳුකම දුරලීමට නැණවත් ව මෙන් ම කඩිසර ව ක්‍රියා කළ යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.)

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - අලස ව ක්‍රියා කිරීමේ ආදීනව ( හිතෝපදේශ6 : 11)
  - අලසයා නිදහසට කරුණු ඉදිරිපත් කරන ආකාරය. (හිතෝපදේශ 26: 13-15)
  - අපගේ දවස්පතා භෝජනය පිළිබඳ ව දෙවිඳුන් ඉදිරියේ යාච්ඤා කළ යුතු බව ( මතෙව් 6:11)
  - ස්වර්ගයෙහි වස්තු රැස් කිරීමට යොමු විය යුතු බව.( මතෙව් 6:19-21)
  - සහනාධාර කටයුතු සඳහා මැදිහත් වූ ආකාරය (ක්‍රියා 6:1)
  - දුක් පීඩා මැද වුව ද තමාට හැකි අයුරින් උපකාර කිරීමේ වැදගත්කම (2කොරින්ති 8:1-5)
  - දිළිඳුන් කෙරෙහි සැලකිලිමත් වෙමින් කටයුතු කළ යුතු බව (ශු ලූක් 16: 19-31)
  - සියල්ල අතහැර දෙවියන් වහන්සේ අනුගාමී වීම (ශු ලූක් 18:22 )
  - ප්‍රීතියෙන් හා ත්‍යාගවන්ත භාවයෙන් යුතුව තමා සතු දේ බෙදා ගත යුතු බව.

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -ශු.ලූක් 18 ׃ 18-30, 16׃19-31, ශු. මතෙව් 6׃11, 19-21,
හිතෝපදේශ 26׃13-15, 6׃6-11, ක්‍රියා , 6׃1 2 කොරින්ති 8׃1-5
කුහුඹුවාගේ පාඩම සටහන් කරන ලද පුවරුව
ඒ 4 කඩදාසි
පැන් වර්ග
බ්‍රිස්ටල් බෝඩ්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

ශු.ලූක් 18 ׃ 18-30, 16׃19-31, ශු. මතෙව් 6׃11, 19-21,
හිතෝපදේශ 26׃13-15, 6׃6-11, ක්‍රියා , 6׃1, 2 කොරින්ති 8׃1-5 කියවන්න.

ඒ පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න.

"දරිද්‍රතාවය පිටු දකිමු "යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක ඉදිරිපත් කිරීමක් සඳහා සූදානම් වන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්**

අලස නොවී කඩිසර වීමට හුරු කරවන්න.

**නිපුණතාව 4:0** : දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩ නැගීමට දායක වෙයි.

**නිපුණතා මට්ටම 11.4.6 :** පීඩිත වූවන් මුදවා ලීමට ක්‍රියා කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල**

- ව්‍යසන හා හිංසා පීඩා පිළිබඳ කරුණු ගොනු කරයි
- පීඩාවට පත් ජනතාවට සහනය සැලසිය යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- හිංසාව පිටු දැකීමට කටයුතු කරයි.
- පීඩාවට පත්වන ජනතාවට සහනය සැලසීමට සහයෝගයෙන් ක්‍රියා කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- සිසුන් අතට ඒ 4 කඩදාසිය බැගින් ලබාදෙන්න.
- විවිධ හේතූන් මත හිංසනයට හා පීඩනයට පත්වන අවස්ථාවක් ලියා පන්තියට ඉදිරිපත් කිරීමට සලස්වන්න.
- ඒ ඇසුරින් පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙය වන්න
  - ව්‍යසන ඇතිවීමෙන් මිනිස් ජීවිත මානසිකව හා ශාරීරිකව පීඩාවට පත්වන බව
  - හිංසා පීඩා පිටුදැකීමට ක්‍රියා කළ යුතු බව
  - ව්‍යසන තත්වයන් ඇතිවූ විට එකිනෙකාට උපකාර කළ යුතු බව.

(මිනිත්තු 20)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 60)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න.
  - ඉශ්‍රායෙල් ජනයා මිසරයේ වහල් බවින් බොහෝ පීඩා විඳි බව.
  - ඉශ්‍රායෙල් ජනතාව පීඩා ඉදිරියේ දෙවියන් වහන්සේට කන්නලව් කළ බව
  - ඉශ්‍රායෙල් ජනතාව මුහුණ දුන් පීඩාවන් දෙවියන්වහන්සේ දුටු බව (නික්මයාම 3:9)
  - දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් වරුන්ගේ කන්නලව්වට සවන් දුන් ආකාරය (නික්මයාම 2:24)
  - ඉශ්‍රායෙල්වරුන්ගේ කන්නලව්වට දෙවියන් වහන්සේ කරුණාව දැක්වූ ආකාරය
  - වහලුන්ට මිදීම ද අන්ධයන්ට පෙනීම ද ලබාදීමට ජේසුස් වහන්සේ මෙලොවට වැඩිය බව (ලූක් 4:18)
  - පීඩාවට පත් ජනතාවට ජේසුස් වහන්සේ සහනයක් වූ බව.
  - විනාශය දෙවියන් වහන්සේගේ කැමැත්ත නොවන බව (ජොහන් 3:16)
  - පීඩා අවස්ථාවන් හි දී ජේසුස් වහන්සේගේ සහනය පැතිය යුතු බව

(මිනිත්තු 40)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -නික්මයාම 2:23-25, 3:9, ශු ලූක් 4:18, ශු. ජොහාන් 3:16
ඒ 4 කඩදාසි
පෑන් වර්ග
බ්‍රිස්ටල් බෝඩ්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

නික්මයාම 2:23-25, 3:9, ලූක් 4:18, ශු. ජොහාන් 3:16 කියවන්න

එම කරුණු පිළිබඳ සාකච්ඡාවක් මෙහෙය වන්න

නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් ඉදිරිපත් කිරීම සඳහා සූදානම් වන්න.

1 කණ්ඩායම:
"ව්‍යසනයට පත් වූවන් මුදවාලමු" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් ඉදිරිපත් කරන්න

2 කණ්ඩායම:
"හිංසනය පිටුදකිමු" යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් ඉදිරිපත් කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්**

අවිහිංසාවාදීව ක්‍රියාකිරීමට යොමු කරවන්න.

**නිපුණතාව 5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත් වැලක් කරගනියි.

**නිපුණතා මට්ටම 11:5 : 1 :** සාධාරණත්වය මත පදනම් වූ ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- ආමොස් ඉදිරිපත් කළ යුක්තිය හා සාධාරණත්වය පිළිබඳ දේව පණිවුඩයට අදාළ කරුණු ගොනු කරයි
- සාධාරණ ව ජීවත්විය යුතු බව පිළිගනියි.
- විවාදයක් පවත්වයි.
- යුක්තිගරුක ව ජීවත් වෙයි.
- යුක්තිය උදෙසා අන් අය සමග එක්ව හඬ නගයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- "දෙවියන් වහන්සේ වෙත හැරී යන්න. ගොස් ජීවත් වන්න." (ආමොස් 5:6)

  "නපුරට ද්වේෂ කරන්න. යහපතට ප්‍රිය වන්න." (ආමොස් 5:15)

  " යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්ද පැවතිය යුතුය." (ආමොස් 5:24)

  බයිබල් පාඨයන් ලියා හුණු පුවරුවේ ප්‍රදර්ශනය කරන්න.

  - එම බයිබල් පාඨයන් කියවීමට අවස්ථාව දෙන්න.
  - පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.
    - ආමොස් යුක්තිය පිළිබඳ දිවැසි වැකි පැවසීම.
    - සාධාරණත්වයේ වටිනාකම පෙන්වීම.
    - නපුර පරාජය කර යහපත ඉටු කළ යුතු බව.
    - මනස්ථාපනය වී යහපත් ජීවිතයකට ඇතුළත් විය යුතු බව.

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - ඉශ්‍රායෙල් ජනතාව ද අයුක්ති සහගත ලෙස ක්‍රියා කළ බව. (ආමොස් 4: 1)
  - අයුක්තියට එරෙහි ව හඬක් නැඟීම. (ආමොස් 4: 4-12)
  - දෙවියන් වහන්සේ බලවත් බව ප්‍රකාශ කිරීම. (ආමොස් 4: 13)
  - දෙවියන් වහන්සේ වෙතට හැරී එන ලෙසට ආරාධනා කළ බව (ආමොස් 5:1-13)

- යුක්තියේ හා සාධාරණත්වයේ ප්‍රතිපත්ති ඉදිරිපත් කළ බව (ආමොස් 5: 14-25)
- යුක්තිගරුක ව ජීවත් විය යුතු බව

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම් :** ශුද්ධ බයිබලය -ආමොස් 4 හා 5 පරිච්ඡේද,
ආමොස් 5:6, 15:15, 5:24 යන බයිබල් කොටස් ලියන ලද පුවරු
ඒ 4 කඩදාසි
මාකර් පෑන්
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

- ආමොස් 4 හා 5 පරිච්ඡේද කියවන්න.
- එහි සඳහන් වන වැදගත් කරුණු සටහන් කරගන්න.
- " ආමොස් තහවුරු කළ යුක්තිය මත පදනම් වූ සාමය හා සාධාරණත්වය වත්මන් සමාජයට අදාළ වේ / නොවේ යන මාතෘකාව යටතේ විවාදයකට සූදානම් වන්න. විවාදය පවත්වන්න.

**ගෙදර පරිසරයෙන්**

යුක්තිගරුක ව හා සාධාරණ ව ජීවත්වීමට හුරු කරවන්න.

**නිපුණතාව 5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත් වැලක් කර ගනියි.

**නිපුණතා මට්ටම 11:5 : 2 :** පිවිතුරු ජීවිතයක් ගත කිරීමට දේව මග පෙන්වීම ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- යෙසායාගේ කැඳවීම හා සේවය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.
- පිවිතුරු ජීවිතයක් ගත කළ යුතු බව පිළිගනියි.
- නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉදිරිපත් කරයි.
- පව් වලට මනස්ථාපනය වෙයි.
- පිවිතුරු ජීවීතයක් ගත කිරීමේ වැදගත්කම අන් අයට ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**

පියවර 1

- ගීතාවලිය 51 : 9-10 ඇතුලත් බයිබල් කොටස ඇසුරෙන් පෝස්ටරයක් නිර්මාණය කර එය පන්තියේ ඉදිරිපත් කරන්න.
- පහත සඳහන් ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.
- මෙම වගන්තිය ලියා ඇත්තේ ශුද්ධ බයිබලයේ කුමන පොතේහි ද?
- මෙය කවුරුන් විසින් කරනු ලබන පාඨයක්ද?
- මෙහි පසුබිම කුමක්ද?
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.
  - දාවිත් විසින් ලියන ලද ගීතාවලියේ සඳහන් වන බව
  - අප ද පාපයට පෙළඹෙන බව.
  - නපුර පරාජය කර යහපත ඉටු කළ යුතු බව.
  - පාප වලට මනස්ථාපනය වීමෙන් ජීවිතය අලුත් කර ගත හැකි බව.

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
  - යෙසායා දර්ශනයක් දුටු බව. (යෙසායා 6:1-4)
  - යෙසායා දෙවියන් වහන්සේ ඉදිරියේ සිය පාපය අවබෝධ කර ගැනීම
  - අප අපගේ පාපය හා නොවටිනාකම ඒත්තු ගත යුතු බව.
  - දෙවියන් වහන්සේ දිවැසි සේවයට කැඳවූ බව. (යෙසායා 6:6)
  - දේව කැඳවීමට අවනත වීම (යෙසායා 6:8)

- දෙවිඳුන් යෙසායා පවිත්‍ර කළ බව (යෙසායා 6:7)
- අපට ද පිවිතුරු ජීවිතයකට කැඳවීමක් ඇති බව
- පිවිතුරු ජීවිතයෙන් දේව කැමැත්ත ඉටු කළ බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -යෙසායා 6/ගීතාවලිය 51:9-10 ලියූ පෝස්ටරය
පාට පැන්සල්
ඒ 4 කඩදාසි
ඇමුණුම 1

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ඇමුණුම 1**

**ගවේෂණය සඳහා උපදෙස්**

- යෙසායා 6 පරිච්ඡේද කියවන්න.
- දෙවිඳුන් විසින් පවිත්‍ර කරනු ලැබ විශේෂ සේවයකට කැඳවීම ලැබූ යෙසායා යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වාර්තාවක් රචනා කරන්න

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

**ගෙදර පරිසරයෙන්**

නිරතුරුව දේව වචනය තුළින් දේව මග පෙන්වීම සෙවීමට යොමු කරවන්න.

**නිපුණතාව 11.5:0** : ශුද්ධ බයිබලය ජීවිතයට අත් වැලක් කරගනියි.

**නිපුණතා මට්ටම 11.5.3 :** සාමය ඇති කිරීමට දායක වෙයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල**

- දිවැසිවර මීකාගේ සාමයේ පණිවිඩ පිළිබඳ කරුණු ගොනු කරයි.
- සාමයෙන් දිවි ගෙවිය යුතු බව පිළි ගනියි.
- පෝස්ටරයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- සාමය ඇති කිරීමට ක්‍රියා කරයි.
- සාමකාමී ලොවක් ගොඩනැගීමට එකමුතුව දායක වෙයි.

පාඩම් සැලසුම සඳහා උපදෙස්

පියවර 1

- ඇමුණුම 2 සිසුන්ට ලබා දෙන්න. (සාමයෙන් සමගියෙන් ගීතය )
- තාලයට ගායනා කිරීමට සලස්වන්න.
- එම ගීතයෙන් මතුවන අදහස් මෙනෙහි කිරීමට අවස්ථාව දෙන්න
- පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාව මෙහෙය වන්න.
    - අප හදවත් තුළ සාමය තිබිය යුතු බව
    - අන් අය සමග සාමයෙන් ජීවත්විය යුතු බව.
    - දෙවියන් වහන්සේ සාමයේ ජීවිත අපේක්ෂා කරන බව.

(මිනිත්තු 10)

පියවර 2

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර ඇමුණුම 1 හා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් ලබා දී කණ්ඩායම් ක්‍රියාකාරකම්වල නිරත කරවන්න. අධීක්ෂණය කරමින් නිසි මග පෙන්වීම ලබා දෙන්න.

(මිනිත්තු 40)

පියවර 3

- සිසු අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පහත කරුණු පදනම් කරගෙන පාඩම සාරාංශ කරන්න..
    - දෙවියන් වහන්සේ සාම යුගයක් උදා කරන බව (මීකා 4:1-2)
    - අන් අය සමග සමාදානයෙන් ජීවත් විය යුතු බව. (මීකා 4:4)
    - දෙවියන් වහන්සේ සියලුම ජාතීන් පිළිගත් බව. (මීකා 4:5)
    - විප්‍රවාස ගතවුවන් හා නැතිවූ අය එකතු කරන බව (මීකා 4:6)
    - සාමයේ ජීවිතයක් ගත කළ යුතු බව.

(මිනිත්තු 30)

**ගුණාත්මක යෙදවුම්** : ශුද්ධ බයිබලය -මීකා 4
බ්‍රිස්ටල් බෝඩ්
පාට පෑන්
ඇමුණුම 1 හා 2

**තක්සේරුව හා ඇගයීම් නිර්ණායක**

මෙම නිපුණතා මට්ටමට අදාළ ව, ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු වන ආකාරයට, නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

## ඇමුණුම 1

## ගවේෂණය සඳහා උපදෙස්

- මීකා 4 පරිච්ඡේදය කියවන්න.
- එමගින් පිළිබිඹු වන සාමය සම්බන්ධ නිර්මාණාත්මක පෝස්ටරයක් නිර්මාණය කරන්න.

තම නිර්මාණ පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න

## ඇමුණුම 2

සාමයෙන් සමගියෙන් - සෙනෙහසින් වෙලී
අත්වැල් බැඳගෙන - කිතු සමි සමගින
නවෝදයක් වෙත පිය නගමු

දිරිය වඩා- සවිය යොදා
රට නංවාලමු නො ලසා
කිතු සමිඳුන් නම පෙරදැරි කරගෙන
සොයුරන් සේ පෙරමුණට යමු

පෙම වඩවා - නපුර නසා - වසමු සදා - සුව විමසා
සව් සත වෙත නිති සෙත සලසන්නට
කිතු හිමි ගිය මග අපිද යමු

**ගෙදර පරිසරයෙන්**

සාමයෙන් දිවි ගෙවීමට හුරු කරවන්න.

## විවිධ සහය

| | |
|---|---|
| පරිඝණක වදන් සැකසුම: | ෂර්වෝන් මෙන්ඩිස් |
| | මංගලිකා විජේරත්න |
| කාර්යාලයීය කටයුතු : | එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය |
| | ඩයස් අමරසිංහ මහතා |